# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2344/17 - 2023 අගෝස්තු මස 09 වැනි බදාදා - 2023.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (422 අධිකාරය) 10(ඇ) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද රෙගුලාසියකි.

ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ,
මුදල් මණ්ඩලයේ සභාපති සහ අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

2023ක් වූ අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

### මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 5 වැනි වගන්තියේ විධිවිධානවල සඳහන් කර ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ (මහ බැංකුවේ) අරමුණු අනුව මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව තහවුරු කිරීම අවශ්‍ය වන හෙයින් ද;

මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව තහවුරු කිරීම සඳහා, මූල්‍ය ආයතනවල පාරිභෝගිකයින්ට සමාන සහ සාධාරණ අයුරින් තරඟකාරී සේවාවක් ලබා ගැනීමට හැකි වන පරිදි එම ආයතන සියලු නෛතික හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වන හෙයින් ද;

මූල්‍ය ආයතනවල පාරිභෝගිකයින්ට ඔවුන්ගේ පැමිණිලි සහ දුක්ගැනවිලි සම්බන්ධයෙන් සහන සඳහා වගකිවයුතු ආයතනයකට ඉදිරිපත් කිරීමට හැකිවීම අත්‍යවශ්‍ය වන හෙයින් ද;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2006 අංක 46 දරන බැංකු පනත මගින් අවසන් වරට සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) වගන්ති යටතේ නිකුත් කර ඇති 2011 අංක 08 දරන බලපත්‍රලාභී බැංකුවල පාරිභෝගික ප්‍රඥප්තිය සහ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය සහ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය යටතේ නිකුත් කර ඇති මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව වඩාත් ශක්තිමත් කිරීම යෝග්‍ය වන හෙයින් ද;

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 10(ඇ) වගන්තිය යටතේ මහ බැංකුවේ මුදල් මණ්ඩලය (මුදල් මණ්ඩලය) විසින් පහත පරිදි රෙගුලාසි නිකුත් කරනු ලබයි.

1. **උපුටා දැක්වීම**

1.1 මෙම රෙගුලාසි උපුටා දක්වනු ලබන්නේ 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි වශයෙනි. **රෙගුලාසි 15, 17, 18.3, 43, 44, 45, 46 සහ 47,** නිකුත් කිරීමේ දින සිට මාස දොළහක් සම්පූර්ණ වන දින බලාත්මක වන අතර අනෙකුත් සියලු ම රෙගුලාසි නිකුත් කිරීමේ දින සිට මාස හයක් සම්පූර්ණ වන දින සිට බලාත්මක වේ.

1.2 මෙම රෙගුලාසි මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය සේවා සපයන්නන් වෙත අදාළ වේ. බලයලත් ප්‍රාථමික අලෙවිකරුවන්, බලයලත් මුදල් හුවමාරුකරුවන්, ගෙවීම් හා පියවීම් පද්ධතිවල සහභාගීවන්නන් ඔවුන්ගේ මෙහෙයුම් කටයුතුවලට අදාළ වන පරිදි මෙම රෙගුලාසිවලට අනුකූල විය යුතු ය.

1.3 මෙම රෙගුලාසිවල විධිවිධානයන් සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධයෙන් මහ බැංකුව විසින් නිකුත් කරන ලද වෙනත් යම් අනුසංගික නීති අතර නොගැලපීමක් ඇති අවස්ථාවක දී මෙම රෙගුලාසි බලපැවැත්වේ.

2. **මහ බැංකුවේ අධිකාරී බලය**

2.1 මූල්‍ය සේවා සපයන්නන් විසින් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ මෙම රෙගුලාසි ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීමේ, ඇගයීමේ හා පරීක්ෂා කිරීමේ සහ ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය සහ පැහැදීම පවත්වා ගැනීමට අදාළ ව කටයුතු කිරීමේ බලය මහ බැංකුව සතු වන්නේය.

2.2 මෙම කර්තව්‍යයේ දී මහ බැංකුව විසින් මෙම රෙගුලාසි සම්බන්ධයෙන් මූල්‍ය සේවා සපයන්නන්ගේ අනුකූලතාව තහවුරු කර ගැනීම සඳහා චක්‍රලේඛ, මාර්ගෝපදේශ සහ චර්යා ධර්ම සංග්‍රහ වරින් වර නිකුත් කිරීම සහ වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය සහ සුදුසු වෙනත් ඕනෑ ම විමර්ශනයක් සිදු කරනු ලැබිය හැකි ය.

2.3 මෙම රෙගුලාසිවල කාර්යයන් සඳහා මහ බැංකුව විසින් ලිඛිත ව බලය පවරන ලද ඕනෑ ම නිලධාරියෙකු හෝ වෙනත් ඕනෑ ම තැනැත්තෙකු විසින් ඕනෑ ම අවස්ථාවක දී ඕනෑ ම මූල්‍ය සේවා සපයන්නෙකුගේ පොත්, වාර්තා, ගිණුම්, ලේඛන, තොරතුරු සහ වෙනත් ක්‍රියාකාරකම් පරීක්ෂා කරනු ලැබිය හැකි ය. මහ බැංකුවට අවශ්‍යයැයි හැඟී යන අවස්ථාවල දී ඕනෑ ම මූල්‍ය සේවා සපයන්නෙකුගේ කටයුතු සම්බන්ධයෙන් සිදු කෙරෙන ඕනෑ ම විමර්ශනයක් සඳහා අදාළ නියාමන අධිකාරීන්ගේ සහය ලබා ගත හැකි ය.

3. මෙම රෙගුලාසි යටතේ, මහ බැංකුව විසින් ලිඛිත ව බලය පවරන ලද ඕනෑ ම නිලධාරියෙකු හෝ වෙනත් ඕනෑ ම තැනැත්තෙකු විසින් මෙම රෙගුලාසි සම්බන්ධයෙන් මූල්‍ය සේවා සපයන්නන්ගේ අනුකූලතාවය තහවුරු කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ගයන්ගෙන් එකක් හෝ කිහිපයක් අනුගමනය කරනු ලැබිය හැකි ය;

i. සඳහන් කරනු ලබන කාලසීමාවක් තුළ හෝ කාලපරාසයන් තුළ, නියම කරනු ලබන ආකාරයෙන් හෝ ආකෘතියකින් අවශ්‍ය වන්නේයැයි සලකනු ලබන තොරතුරු සැපයීමට ඕනෑ ම මූල්‍ය සේවා සපයන්නෙකු හට නියම කිරීම;

ii. මුද්‍රිත ව, ඉලෙක්ට්‍රොනික ව හෝ වෙනත් ඕනෑ ම ආකාරයකින් පවත්වාගෙන යනු ලබන පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර්, හෝ වෙනත් එවැනි ලේඛන ඉදිරිපත් කිරීමට හා එවැනි පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර්, හෝ වෙනත් එවැනි ලේඛනවල සහතික පිටපත් අවශ්‍ය වන ඕනෑ ම ආකාරයකින් ඕනෑ ම මූල්‍ය සේවා සපයන්නෙකු හට සැපයීමට නියම කිරීම;

iii. ඕනෑ ම මූල්‍ය සේවා සපයන්නෙකුගේ පරිශ්‍රයට හෝ ගබඩා ප්‍රදේශයට ඇතුළු වී එම මූල්‍ය සේවා සපයන්නාගේ මුද්‍රිතව, ඉලෙක්ට්‍රොනිකව හෝ වෙනත් ආකාරයකින් පවත්වාගෙන යනු ලබන පොත්,වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර්, හෝ වෙනත් එවැනි ලේඛන පරීක්ෂා කිරීම හා එවැනි පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර්, හෝ වෙනත් එවැනි ලේඛනවල සහතික කළ හෝ නොකළ පිටපත් ලබා ගැනීම; සහ

iv. ඕනෑ ම මූල්‍ය සේවා සපයන්නෙකුගේ ව්‍යාපාර කටයුතු පිළිබඳ අවබෝධයක් ඇති හෝ ඒ පිළිබඳ දැනුවත්භාවයක් ඇති හෝ එම තොරතුරු සන්තකයේ පවතින හෝ එසේ ඇති බවට පෙනී යන ඕනෑ ම පුද්ගලයෙකුගෙන් ලිඛිත දැන්වීමකින් තොරතුරු ඉල්ලා සිටීම හා අවශ්‍ය වන්නේ නම් එම තැනැත්තා සම්මුඛ සාකච්ඡාවක් සඳහා කැඳවීම.

4. **වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය**

4.1. සලකා බලනු ලබන මූල්‍ය සේවා සපයන්නන්ගේ ව්‍යාපාරයන්, වෙළෙඳපොළ සහ සලකා බලනු ලබන කාරණයේ ස්වභාවය, විශාලත්වය හා සංකීර්ණත්වය සැලකිල්ලට ගෙන මහ බැංකුව විසින් බලය පවරන ලද ඕනෑ ම නිලධාරියෙකු හෝ වෙනත් ඕනෑ ම තැනැත්තෙකු විසින් මූල්‍ය පාරිභෝගිකයින්ගේ අයිතීන් සහ අභිලාෂයන් ආරක්ෂා කිරීමේ අරමුණින්, මූල්‍ය සේවා සපයන්නන්ගේ වෙළෙඳපොළ හැසිරීමට අදාළ විමර්ශනයන් සිදු කිරීම හෝ ඒ සඳහා කටයුතු කිරීම කළ යුතු ය.

4.2. එවැනි විමර්ශනයක් සම්පූර්ණ කළ පසු, මහ බැංකුව විසින් බලය පවරන ලද ඕනෑ ම නිලධාරියෙකු හෝ වෙනත් ඕනෑ ම තැනැත්තෙකු විසින්, වෙළෙඳපොළ හැසිරීම පිළිබඳ වාර්තාවක් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. එම වාර්තාවේ මෙම රෙගුලාසින් හෝ වෙනත් ඕනෑ ම චක්‍රලේඛ, මාර්ගෝපදේශ, හෝ චර්යා ධර්ම සංග්‍රහයන් සැලකිය යුතු ලෙස උල්ලංඝනය කිරීම් හෝ අසාධාරණ, අහිතකර හෝ අයෝග්‍ය ව්‍යාපාර පරිචයන් පිළිබඳ ව විශ්ලේෂණයන් ඇතුළත් විය යුතු අතර එබඳු උල්ලංඝනය කිරීම් හෝ පරිචයන් වළක්වා ගැනීමට අදාළ නිර්දේශයන් ඇතුළත් විය යුත්තේ ය.

4.3. මහ බැංකුව විසින් අවශ්‍යයයි හැඟෙන අවස්ථාවන්හි දී පහත ඒවායින් එකක් හෝ කිහිපයක් කරනු ලැබිය හැකි ය;

i. ඕනෑ ම මූල්‍ය සේවා සපයන්නෙකු විසින් උල්ලංඝනය කරනු ලැබූ හෝ අනුගත වීමට අපොහොසත් වී ඇති මෙම රෙගුලාසින්හි විධි විධානයන් හෝ චක්‍රලේඛ හෝ මාර්ගෝපදේශ හෝ චර්යා ධර්ම සංග්‍රහයන් හෝ ඒ යටතේ පනවා ඇති අවශ්‍යතාවයන්ට වහා ම හෝ දක්වා ඇති යම් කාල සීමාවක් තුළ අනුගත වීමට එම මූල්‍ය සේවා සපයන්නන් හට නියම කිරීම;

ii. එබඳු පරිචයන් හෝ උල්ලංඝනයන් හේතුවෙන් ඇති වන තත්ත්වයන් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ඕනෑ ම මූල්‍ය සේවා සපයන්නෙකු හට නියම කිරීම;

iii. හේතු විමසීමේ ලිපියක් හෝ මෙම රෙගුලාසි යටතේ ගත හැකි නියාමන ක්‍රියාමාර්ග දක්වමින් අවවාදාත්මක ලිපියක් ඕනෑ ම මූල්‍ය සේවා සපයන්නෙකු වෙත නිකුත් කිරීම; සහ

iv. වැඩිදුර විමර්ශන හෝ නියාමන ක්‍රියාමාර්ග සඳහා එවැනි උල්ලංඝනය කිරීම් හෝ ප්‍රශ්නගත කාරණය, මහ බැංකුවේ අදාළ නියාමන දෙපාර්තමේන්තු/ව වෙත යොමු කිරීම.

5. මෙම රෙගුලාසි යටතේ තමා වෙත පනවා ඇති අවශ්‍යතාවන්ට අනුගත වීම මූල්‍ය සේවා සපයන ආයතනයේ සෑම තැනැත්තෙකුගේ ම වගකීම වන්නේ ය.

i. මෙම රෙගුලාසිය යටතේ අවශ්‍ය වන්නා වූ තොරතුරක් සැපයීමට හෝ ඕනෑ ම පොතක්, වාර්තාවක්, ලිපි ගොනුවක්, රෙජිස්ටරයක් හෝ වෙනත් එවැනි ලේඛනයක්, භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම;
ii. සම්මුඛ සාකච්ඡාවක් සඳහා කැඳවනු ලැබ ඇති විට ඊට පෞද්ගලිකව සහභාගී වීමට අපොහොසත් වීම;
iii. අසත්‍ය, අසම්පූර්ණ හෝ වැරදි හෝ නොමඟ යවන ආකාරයේ තොරතුරක්, පොතක්, වාර්තාවක්, ලිපි ගොනුවක්, රෙජිස්ටරයක් හෝ වෙනත් එවැනි ලේඛනයක්, භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් ලබා දීම; හෝ
iv. මෙම රෙගුලාසි යටතේවන යම් කාර්යයක් ඉටු කිරීමේ දී මහ බැංකුව විසින් බලය පවරන ලද නිලධාරියකුට හෝ වෙනත් යම් තැනැත්තෙකුට බාධා කිරීම සිදු නොකළ යුත්තේ ය.

6. **රෙගුලාසි 4** යටතේ සකස්කර ඉදිරිපත් කරන වාර්තාව පදනම් කර ගනිමින්, මුදල් මණ්ඩලය විසින්, යම් මූල්‍ය සේවා සපයන්නෙකු:

i. තම මූල්‍ය පාරිභෝගිකයන්ගේ අයිතීන්ට හා අභිලාෂයන්ට හානිකර අන්දමේ අසාධාරණ, අයහපත් හෝ අයෝග්‍ය පරිචයන් අනුගමනය කරමින් තම කටයුතු කරගෙන යන බව හෝ එසේ කිරීමට හැකියාව ඇති බව; හෝ

ii. මෙම රෙගුලාසිවල යම් විධිවිධාන හෝ මේ යටතේ නිකුත් කරනු ලබන චක්‍රලේඛ, මාර්ගෝපදේශ, චර්යා ධර්ම සංග්‍රහයන් උල්ලංඝනය කර හෝ අනුගත වීමට අපොහොසත් වී ඇති බව;
මුදල් මණ්ඩලයේ අදහස වන්නේ නම් ඔවුන් විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ගයන්ගෙන් එකක් හෝ කිහිපයක් ගනු ලැබිය හැකිය;

අ) එවැනි ඕනෑ ම පරිචයක් නැවත්වීමට අදාළ මූල්‍ය සේවා සපයන්නාට නියෝග කිරීම;
ආ) එවැනි පරිචයක් හෝ උල්ලංඝනයක් හේතුවෙන් ඇති වන තත්ත්වයන් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අදාළ මූල්‍ය සේවා සපයන්නන්ට නියෝග කිරීම;
ඇ) යම් මූල්‍ය නිපැයුමක හෝ සේවාවක විශේෂාංග, නියමයන් හෝ කොන්දේසි සංශෝධනය කිරීමට අදාළ මූල්‍ය සේවා සපයන්නාට නියෝග කිරීම;
ඈ) යම් මූල්‍ය නිපැයුමක් හෝ සේවාවක් වෙළෙඳපොළෙන් ඉවත් කිරීමට අදාළ මූල්‍ය සේවා සපයන්නාට නියෝග කිරීම;
ඉ) වෙළෙඳපොළෙන් හෝ මාධ්‍ය තුළින් ඕනෑ ම වෙළෙඳ දැන්වීමක් ඉවත් කිරීමට අදාළ මූල්‍ය සේවා සපයන්නාට නියෝග කිරීම;

ඊ) මූල්‍ය පාරිභෝගිකයන් වෙත වන්දි ගෙවීමට හෝ මුදල් ආපසු ලබා දීමට අදාළ මූල්‍ය සේවා සපයන්නාට නියෝග කිරීම;

උ) මුදල් මණ්ඩලයේ විශේෂ අධීක්ෂණ අවධානයට ලක්ව ඇති මූල්‍ය සේවා සපයන්නෙකු ලෙස අදාළ මූල්‍ය සේවා සපයන්නාගේ නාමය ප්‍රසිද්ධියට පත් කිරීම; සහ

ඌ) අදාළ මූල්‍ය සේවා සපයන්නාට විරුද්ධ ව නියාමන ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා නියාමන දෙපාර්තමේන්තු/ව වෙත යොමු කිරීම.

7. රෙගුලාසි 2 සහ ප්‍රශ්නගත පාර්ශ්වයන්ගේ අධිකරණ ක්‍රියාමාර්ගයන්ට ප්‍රවේශ වීමේ අයිතියට අගතියකින් තොර ව, මහ බැංකුව විසින්, අගතියට පත් මූල්‍ය පාරිභෝගිකයන්ට විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයක් ඇතිකළ යුතු ය. මෙම විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයට අදාළ ක්‍රියාවලිය සහ ක්‍රියාපටිපාටිය **රෙගුලාසි 47** යටතේ විස්තර කර ඇත.

**මූල්‍ය සේවා සපයන්නන්ගේ පාලනය**

8. **අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

මූල්‍ය සේවා සපයන්නාගේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ විදේශ බැංකුවලට අදාළව කළමනාකරණ කමිටුව/ විධායක කමිටුව (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් හැඳින්වෙන) විසින් පහත පරිදි තම මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමට බැඳී සිටී:

i. මූල්‍ය සේවා සපයන්නාට සුදුසු මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටින් අනුමත කිරීම හා අනුගත කිරීම සහ එම ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටින් මෙම රෙගුලාසිවල විධිවිධානවලට සහ මේ යටතේ නිකුත් කරනු ලබන චක්‍රලේඛ, මාර්ගෝපදේශ, චර්යා ධර්ම සංග්‍රහයන්ට අනුකූල ව අධීක්ෂණය සහ පුනරීක්ෂණය;

ii. සේවකයින් සහ මූල්‍ය සේවා සපයන්නා විසින් පත් කරනු ලැබූ නියෝජිතයන්/ තෙවැනි පාර්ශ්වයන්ට අදාළව නිකුත් කරන ලද අභ්‍යන්තර පාලන සහ චර්යා ධර්ම සංග්‍රහයන් ඇතුළු ව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ව්‍යුහයක් සහිත ක්‍රියා පටිපාටි, පද්ධති සහ සම්පත් ස්ථාපනය කරන බවට සහතික කළ යුතු ය;

iii. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ කාර්යය ඉටු කිරීම හා වරින්වර මණ්ඩලයට වාර්තා කිරීම සඳහා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු පත් කිරීම;

iv. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විසින් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාකාරකම් නියාමනය, ඇගයීම සහ අර්ධ වාර්ෂික ව මණ්ඩලය වෙත වාර්තා කිරීම, සහතික කිරීම සහ මහ බැංකුව සමග සම්බන්ධීකරණය; සහ

v. සියලු ම සේවකයින් සහ පත් කරන ලද නියෝජිතයින්/ තෙවැනි පාර්ශ්වයන් මෙම රෙගුලාසි මගින් ස්ථාපනය කර ඇති මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ අවශ්‍යතාවයන්ට අනුගත වන බවට මණ්ඩලය සහතික විය යුතු ය. මෙම රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා සුදුසු නියාමන යාන්ත්‍රණයක් ස්ථාපනය කරන බවට මණ්ඩලය සහතික කළ යුතු ය.

9. **ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ වගකීම**

මූල්‍ය සේවා සපයන්නන්ගේ මණ්ඩලය විසින් පත් කරන ලද කළමනාකරණ කාර්ය මණ්ඩලයේ වගකීම්වලට පහත කරුණු ඇතුළත් විය යුතු නමුත් ඒවාට පමණක් සීමා නොවිය යුතු යः

i. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි මෙම රෙගුලාසිවලට සහ මෙම රෙගුලාසි යටතේ නිකුත් කරනු ලබන චක්‍රලේඛ, මාර්ගෝපදේශ සහ චර්යා ධර්ම සංග්‍රහයන්ට අනුකූල බව සහතික කිරීම සඳහා අනෙකුත් අභ්‍යන්තර ව්‍යාපාර ඒකක අතර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව සඳහා සුදුසු යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම;

ii. පැමිණිලි පිළිබඳ දත්ත සහ මෙහෙයුම් වාර්තා ඇතුළු මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාකාරකම් නියාමනය, ඇගයීම සහ වාර්තා කිරීම;

iii. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සහතික කිරීම සඳහා මූල්‍ය නිපැයුම් සහ/ හෝ සේවා සපයන ඕනෑ ම නියෝජිතයකුගේ සහ/ හෝ තෙවන පාර්ශ්වයක මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධ මෙහෙයුම් නිරීක්ෂණය සහ අධීක්ෂණය;

iv. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධ අනුකූලතා අවදානමක් ඇති මූල්‍ය නිපැයුම් සහ සේවා හඳුනා ගැනීම සහ එම අවදානම් කළමනාකරණය කිරීමට ක්‍රියාමාර්ග ගැනීම;

v. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් දැනුමක් සහ විශේෂඥතාවක් සහිත කාර්ය මණ්ඩලයක් යෙදවීම සහතික කිරීම; සහ

vi. ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, පද්ධති යනාදී මෙම රෙගුලාසිවලට අදාළ කරුණු සම්බන්ධයෙන් මූල්‍ය පාරිභෝගිකයින් සමග සම්බන්ධ වී සිටින සේවකයින්, නියෝජිතයින් සහ මූල්‍ය සේවා සපයන්නන් විසින් පත් කරන ලද තෙවන පාර්ශ්වයන් සඳහා අදාළ පුහුණුව ලබා දීම සහතික කිරීම.

**10. මෙහෙයුම් කළමනාකරණ කාර්ය මණ්ඩලයේ වගකීම**

මූල්‍ය සේවා සපයන්නන්ගේ මෙහෙයුම් කළමනාකරණ කාර්ය මණ්ඩලයේ වගකීම්වලට පහත කරුණු ඇතුළත් විය යුතු නමුත් ඒවාට පමණක් සීමා නොවිය යුතු යඃ

i. මෙම රෙගුලාසිවලට සහ මේ යටතේ නිකුත් කරනු ලබන චක්‍රලේඛ, මාර්ගෝපදේශ සහ චර්යා ධර්ම සංග්‍රහයන්ට අනුකූල ව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය සේවා සපයන්නා විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ පද්ධති ක්‍රියාත්මක කිරීම;

ii. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා සහ තොරතුරු පවත්වාගෙන යෑම; සහ

iii. මණ්ඩලයට හෝ කළමනාකරණ කාර්ය මණ්ඩලයට අවශ්‍ය වන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය හා සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා කලින්කලට ලබා දීම.

**11. අභ්‍යන්තර පාලන**

11.1 අවදානම් ක්ෂේත්‍ර සහ ව්‍යුහයන් ඇතුළු ව මෙම රෙගුලාසි සහ මේ යටතේ නිකුත් කරනු ලබන චක්‍රලේඛ, මාර්ගෝපදේශ සහ චර්යා ධර්ම සංග්‍රහයන්ට අනුකූල ව සහ ව්‍යාපාරික උපාය මාර්ගයට ගැළපෙන පරිදි මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ පද්ධති ව්‍යාපාරය පුරා ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා මූල්‍ය සේවා සපයන්නා හට ඵලදායී අභ්‍යන්තර පාලනයක් තිබිය යුතු ය.

11.2 මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ගැටලු හඳුනා ගැනීම, සටහන් කිරීම, නියාමනය, පාලනය සහ වාර්තා කිරීම සඳහා මූල්‍ය සේවා සපයන්නා විසින් සුදුසු යාන්ත්‍රණයක් ස්ථාපනය කළ යුතු ය.

11.3 මූල්‍ය සේවා සපයන්නන් විසින් මෙම රෙගුලාසි යටතේ සඳහන් කරන ලද පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටියට අදාළ අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා නිසි යාන්ත්‍රණ සම්පාදනය කළ යුතු ය.

**12. ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි**

12.1 මූල්‍ය සේවා සපයන්නා සතු ව පහත දැක්වෙන කරුණුවලට සීමා නොවී ඒවා ඇතුළත් ව සුදුසු මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි පැවතිය යුතු යඃ

i. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාකාරකම්වල නියැලී සිටින සියලු ම මට්ටම්වල සේවකයින්ගේ භූමිකාවන් සහ වගකීම් විස්තර කිරීම;

ii. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණයට අදාළ වන රෙගුලාසි, චක්‍රලේඛ, මාර්ගෝපදේශ, චර්යා ධර්ම සංග්‍රහ සහ අභ්‍යන්තර ක්‍රියාපටිපාටිවලට අනුකූල වීම සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, නියාමනය සහ පාලනය කිරීම;

iii. අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්ව සමග මූල්‍ය පාරිභෝගිකයින්ගේ වැදගත් තොරතුරු හුවමාරු කර ගැනීම;

iv. පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලිය සහ අනෙකුත් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් ඇතුළු තොරතුරු අනාවරණය කිරීම;

v. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම, මැනීම, නියාමනය සහ පාලනය සඳහා මූල්‍ය නිපැයුම් සහ සේවා ඇගයීම;

vi. දත්ත සුරක්ෂිතතාව සහ රහස්‍යභාවය;

vii. පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය;

viii. වංචා, සොරකම්, අයතා පරිහරණය සහ අවභාවිතය වැනි සිදුවීම්වලට එරෙහිව මූල්‍ය පාරිභෝගිකයන්ගේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර පාලනයන් සහ එවැනි සිද්ධි නිරාකරණය කිරීමේ ක්‍රියාපටිපාටි; සහ

ix. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණයේ ප්‍රමාණවත් බව තහවුරු කර ගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධති, පාලන පද්ධති උල්ලංඝනය කිරීම් සහ අඩුපාඩු, අවදානම් කළමනාකරණ පරිචයන්, දත්ත ආරක්ෂාව, තොරතුරු කළමනාකරණ පද්ධති ආදී ක්ෂේත්‍ර ආවරණය වන කලින්කල සිදුවන විගණන පරිචයන්.

12.2 මූල්‍ය සේවා සපයන්නා විසින් අවම වශයෙන් සෑම වසර දෙකකට වරක් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සමාලෝචනය කළ යුතු අතර එහි සංශෝධන සිදු කරන්නේ නම් තම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු ය.

**සාධාරණව සැලකීම සහ වගකීම්සහගත ව්‍යාපාරකරණය**

**13. ප්‍රවේශතා ප්‍රතිපත්තිය සකස් කිරීම**

13.1 මූල්‍ය සේවා සපයන්නා විසින් මූල්‍ය පාරිභෝගිකයාගේ සමාජ තත්ත්වය, ශාරීරික හැකියාව, විවාහ-අවිවාහකබව, වර්ගය, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ආගම සහ මූල්‍ය සාක්ෂරතාව නොසලකා මූල්‍ය නිපැයුම් සහ සේවා සඳහා සාධාරණ සහ සමාන ප්‍රවේශය වැඩි දියුණු කිරීමේ අරමුණින් ප්‍රවේශතා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු ය.

13.2 ප්‍රවේශතා ප්‍රතිපත්තියෙහි පහත අංග ඇතුළත් විය යුතු අතර ඒවාට පමණක් සීමා නොවිය යුතු ය :

i. ලේඛන, සන්නිවේදනය සහ තොරතුරු සඳහා ප්‍රවේශය,
ii. වෙබ් අඩවි සහ ජංගම යෙදුම් සඳහා ප්‍රවේශය,
iii. යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය,
iv. කාඩ්පත් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සඳහා ප්‍රවේශය සහ වෙනත් සමාන සේවා සඳහා ප්‍රවේශය.

13.3 මූල්‍ය සේවා සපයන්නන් විසින් වෙනස්කම් කොට සැලකීම හෝ ප්‍රවේශ විය නොහැකි බව දිරිමත් වන ආකාරයේ ප්‍රතිපත්ති හෝ චක්‍රලේඛ නිකුත් නොකළ යුතු ය.

13.4 ප්‍රවේශතා ප්‍රතිපත්තිය පොදු ජනතාවට ප්‍රවේශ විය හැකි ආකෘතිවලින් ලබා ගත හැකි විය යුතු ය.

**14. වෙනස්කම් කොට නොසැලකීම**

14.1 මූල්‍ය සේවා සපයන්නන් මූල්‍ය පාරිභෝගිකයින්හට මූල්‍ය සේවා සැපයීමේදී ඔවුන්ගේ සමාජ තත්ත්වය, ශාරීරික හැකියාව, විවාහ-අවිවාහකබව, වර්ගය, කුලය, ස්ත්‍රී පුරුෂභාවය, වයස, ආගම හෝ මූල්‍ය සාක්ෂරතාවය වැනි මූල්‍ය සේවා සැපයීමට අදාළ නොවන කරුණු මත පදනම් ව වෙනස් ආකාරයෙන් නොසැලකිය යුතු ය. කෙසේ වුවද මූල්‍ය සේවා සපයන්නන් හට පාරිභෝගිකයින් වෙත විශේෂ මූල්‍ය නිපැයුම් සහ සේවා සැපයීම සඳහා මෙම රෙගුලාසි බාධාවක් නොවිය යුතු ය.

14.2 මූල්‍ය සේවා සපයන්නන් වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත, අඩු ආදායම්ලාභී, මූල්‍ය සාක්ෂරතාවය අඩු මූල්‍ය පාරිභෝගිකයින්ට මූල්‍ය නිපැයුම් සහ සේවා වෙත සාධාරණ ප්‍රවේශයක් ලබාදීම තහවුරු කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

**15. යටිතල පහසුකම්**

15.1 මූල්‍ය සේවා සපයන්නා විසින් නව ගොඩනැගිලි හා භෞතික යටිතල පහසුකම් ඉදිකිරීමේ දී, විශේෂ අවශ්‍යතා සහිත හා වැඩිහිටි මූල්‍ය පාරිභෝගිකයින්ට පහසුකම් සැලසීම වැනි ප්‍රවේශතාව පිළිබඳ සාමාන්‍ය නීතිවලට අනුකූල විය යුතු ය.

15.2 තිර කියවනය සහ අනෙකුත් ප්‍රවේශතා විශේෂාංග සක්‍රීය කිරීම මගින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ අනෙකුත් ස්වයංක්‍රීය උපකරණ ස්ථාපනයේදී සහ ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රවේශතාව වැඩිදියුණු කිරීමට මූල්‍ය සේවා සපයන්නන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.

15.3 මූල්‍ය සේවා සපයන්නන් විසින් මූල්‍ය පාරිභෝගිකයාගේ ඉල්ලීම පරිදි ප්‍රවේශතා විශේෂාංග සහිත කාඩ්පත් (හරපත් සහ බැරපත්) ලබා දිය යුතු ය.

**16. අත්සන් සත්‍යාපනය**

මූල්‍ය සේවා සපයන්නා විසින් විද්‍යුත් ක්‍රම මගින් මූල්‍ය පාරිභෝගිකයන් හඳුනාගැනීමේ ක්‍රම ද ඇතුළත් ව මූල්‍ය පාරිභෝගිකයාගේ අත්සන පැහැදිලි සහ සත්‍යාපන අරමුණු සඳහා පිළිගත හැකි බව සහතික කළ යුතු ය. මහපට ඇඟිලි සලකුණ සාම්ප්‍රදායික අත්සන හා සමාන ව සලකනු ලැබේ.

**17. වෙබ් ප්‍රවේශතාව**

17.1 සියලු ම වෙබ් අන්තර්ගතයන් හඳුනාගත හැකි, ක්‍රියාත්මක කළ හැකි, තේරුම්ගත හැකි සහ මනා ලෙස සැකසූ ඒවා විය යුතු ය.

17.2 වෙබ් ප්‍රවේශතාව සම්බන්ධයෙන් පහත කරුණු අඩංගු විය යුතු අතර ඒවාට පමණක් සීමා නොවිය යුතු ය :

i. අකුරුවල ප්‍රමාණය, වර්ණය සහ වර්ණ පරස්පර ගැලපුම් හැකියාව,
ii. සම්පූර්ණ සංචරණය සහ යතුරුපුවරුව සමග ක්‍රියා කිරීමේ හැකියාව,
iii. තිර කියවනය සමග සම්පූර්ණයෙන්ම කියවීමේ හැකියාව,
iv. සියලු ම වෙබ් මූලිකාංග සුදුසු ලෙස නම් කිරීම හෝ විකල්ප පාඨ භාවිත කිරීම කළ යුතු ය,
v. සියලු ම ආරක්ෂිත හෝ සුරකුම් අංග පාඨ ආකාරයෙන් සහ ශ්‍රව්‍ය මාධ්‍යයෙන් තෝරා ගැනීම සඳහා සපයා තිබිය යුතු ය,
vi. සියලු ඉටු කළ යුතු කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දිය යුතු ය.

17.3 ජංගම යෙදවුම් (Mobile Applications) ප්‍රවේශතාවයට පහත කරුණු ඇතුළත් විය යුතු අතර ඒවාට සීමා නොවිය යුතු ය :

i. අකුරුවල ප්‍රමාණය, වර්ණ සහ වර්ණ වෙනස සහ පසුබිම් වර්ණ ගැලපුම් හැකියාව,
ii. ජංගම යෙදවුම් භාවිතයේදී සම්පූර්ණ සංසරණ හැකියාව,
iii. තිර කියවනය සමග සම්පූර්ණයෙන්ම කියවීමේ හැකියාව,
iv. සියලු ම ජංගම යෙදවුම් මූලිකාංග සුදුසු ලෙස නම් කිරීම හෝ විකල්ප පාඨ භාවිතා කළ යුතු ය,

v. සියලු ම ආරක්ෂිත හෝ සුරැකුම් අංග පාඨ ආකාරයෙන් හෝ ශ්‍රව්‍ය මාධ්‍යයෙන් තෝරා ගැනීම සඳහා සපයා තිබිය යුතු ය,

vi. සියලු ම ඉටු කළ යුතු කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දිය යුතු ය.

**18. තොරතුරු සඳහා ප්‍රවේශතාවය**

18.1 මූල්‍ය සේවා සපයන්නා විසින් මූල්‍ය පාරිභෝගිකයාගේ ඉල්ලීම පරිදි, ප්‍රවේශ විය හැකි ආකෘතිවලින් අවශ්‍ය සියලු ම ලියකියවිලි සැපයිය යුතු ය.

18.2 මූල්‍ය සේවා සපයන්නා විසින් මූල්‍ය පාරිභෝගිකයන් හට ඔවුන් විසින් ඇටෝර්නි බලපත්‍රයක්, අධිකාරී ලිපියක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් මගින් බලය පවරන ලද පුද්ගලයෙකුගෙන් සහය ලබා ගැනීමට අවසර ලබා දිය යුතු ය.

18.3 මූල්‍ය සේවා සපයන්නා විසින් උපකාරී තාක්ෂණය (Assistive Technology) සහ උපකරණ භාවිත කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයිය යුතු ය.

**19. අසාධාරණ ව්‍යාපාර පරිචයන්**

19.1 මූල්‍ය සේවා සපයන්නා හෝ එහි නියෝජිතයකු/ මූල්‍ය සේවා සපයන්නා විසින් පත්කරන ලද තෙවන පාර්ශ්වයක් විසින් එහි මූල්‍ය පාරිභෝගිකයින් හට අනර්ථකාමී අසාධාරණ ව්‍යාපාර පරිචයන් ක්‍රියාවේ නොයෙදවිය යුතු ය.

19.2 මූල්‍ය සේවා සපයන්නා මූල්‍ය නිපැයුම් සහ සේවාවන් සැපයීමේදී සෑම විටම සද්භාවයෙන් ක්‍රියා කළ යුතු අතර නොසැලකිලිමත් ලෙස ක්‍රියා නොකළ යුතු ය.

19.3 ඉහත **උප රෙගුලාසි 19.1** හි සඳහන් "අසාධාරණ ව්‍යාපාර පරිචයන්" යන්නට පහත සඳහන් අසාධාරණ, වංචාසහගත හෝ අපවාදාත්මක පරිචයන් ඇතුළත් වන අතර ඒවාට පමණක් සීමා නොවේ :

i. අපවාදාත්මක ණය අයකර ගැනීමේ පිළිවෙත්;

ii. මහ බැංකුව විසින් පනවා ඇති සීමාවන් ඇත්නම් ඒවා ඉක්මවන අයුරින් ණය පහසුකම් සඳහා උපචිත නොවූ (අනාගත) පොළී/කලින් පියවීමේ ගාස්තු ගෙවීමට අවශ්‍ය වීම;

iii. මූල්‍ය පාරිභෝගිකයාගේ පූර්ව අනුමැතියකින් තොර ව ණය සීමාවන් ස්වයංක්‍රීය ව වැඩි කිරීම;

iv. දරන ලද පිරිවැයට සාපේක්ෂව අධික ගාස්තු, දඩ මුදල්, අනාගත පොළිය සහ අයකිරීම් පැනවීම;

v. පූර්ව ලිඛිත දැන්වීමකින් තොර ව ගාස්තු සහ අයකිරීම් පැනවීම;

vi. අනෙක් පාර්ශ්වයේ ලිඛිත අනුමැතියකින් තොරව මූල්‍ය නිපැයුම් සහ සේවා සඳහා එකඟ වූ නියමයන් සහ කොන්දේසි වෙනස් කිරීම;

vii. මූල්‍ය පාරිභෝගිකයාගේ ලිඛිත අවසරයකින් තොර ව ඔවුන් හට බැඳීමක් ඇති කරවන වගන්ති භාවිතයෙන්, තැන්පතු ගිණුම් සහ බැඳී ඇති ණය පහසුකම් සඳහා ස්වයංක්‍රීය ව ගෙවීම් සහ ගාස්තු අඩු කිරීම;

viii. මූල්‍ය පාරිභෝගිකයාගේ වරණයන් අනිසි ලෙස සීමා කරමින් මූල්‍ය නිපැයුම් සහ සේවා එකට එකතු කිරීමේ සහ ඈඳීමේ පරිචයන්;

ix. මූල්‍ය පාරිභෝගිකයින්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම අනිසි ලෙස ප්‍රමාද කිරීම;

x. මූල්‍ය පාරිභෝගිකයින්ගේ අයිතීන් සහ බැඳියාවන් සම්බන්ධයෙන් ඕනෑ ම අවස්ථාවක ඕනෑ ම අසාධාරණ නියමයන් සහ කොන්දේසි පැනවීම;

xi. මූල්‍ය පාරිභෝගිකයින් විසින් ගිවිසුම අවසන් කිරීම, මූල්‍ය සේවා සපයන්නා වෙනස් කිරීම හෝ මූල්‍ය නිපැයුම/ සේවාව වෙනස් කිරීම වැළැක්වීම.

**20. විකුණුම් පරිචයන්**

මූල්‍ය සේවා සපයන්නා;

i. මූල්‍ය නිපැයුම් හෝ සේවා විකිණීම සඳහා පැහැදිලි විකුණුම් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සකස් කළ යුතු ය,

ii. මූල්‍ය නිපැයුම් සහ සේවා විකිණීම/අලෙවිය/ප්‍රවර්ධනය සම්බන්ධ ක්‍රියාකාරකම්වල යෙදී සිටින පුද්ගලයන්, එම නිපැයුම් සහ සේවාවල ප්‍රධාන ලක්ෂණ, අවදානම්, වැදගත් නියමයන් සහ කොන්දේසි පිළිබඳ ව පුහුණුවක් සහ දැනුමක් ලබා ඇති බව සහ චර්යා ධර්ම සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියාපටිපාටි සහ පරිචයන්ට අනුව සාධාරණ ව සහ යුක්තිසහගත ව ක්‍රියාකරන බව සහතික කළ යුතු ය,

iii. විකුණුම් ක්‍රියාවලිය අතරතුර, හානිකර විකුණුම් පරිචයන්ගෙන් සහ මූල්‍ය පාරිභෝගිකයකුට නුසුදුසු මූල්‍ය නිපැයුම් හෝ සේවාවන්, අදූරදර්ශී ව හෝ නොසැලකිලිමත්ව විකිණීමෙන් වැළකිය යුතු ය,

iv. ලිඛිත විකුණුම් මාධ්‍ය ඇතුළු ව ඕනෑ ම ආකාරයක විකුණුම් හා සම්බන්ධ මාධ්‍යයක මූල්‍ය නිපැයුමක් හෝ සේවාවක් පිළිබඳ අනතුරු ඇඟවීම් හෝ අවවාදාත්මක ප්‍රකාශයන් අඩු කර දැක්වීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය,

v. මූල්‍ය සේවා සපයන්නා සහ මූල්‍ය පාරිභෝගිකයා අතර පවත්නා බැඳියාව පිළිබඳ ගැටුම්වලින් මූල්‍ය පාරිභෝගිකයින් හට සිදුවන අහිතකර බලපෑම වැළැක්වීම සඳහා, එවැනි ගැටුම් හඳුනාගැනීමට සහ වැළැක්වීමට හෝ කළමනාකරණය කිරීමට සුදුසු/සාධාරණ පියවර ගත යුතු ය,

vi. උපදේශන සේවා සහ තෙවැනි පාර්ශ්වීය නිපැයුම්වල දී පවතින සහ සිදුවිය හැකි බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ ව මූල්‍ය පාරිභෝගිකයින්හට හෙළිදරව් කළ යුතු ය.

**21. අසාධාරණ ගිවිසුම් නියමයන්**

21.1 මූල්‍ය පාරිභෝගිකයා හට අවාසි සහගතවන පරිදි, අයිතිවාසිකම් සහ බැඳීම්වල අසමතුලිතතාවක් ඇති කරන පහත සඳහන් ආකාරයේ නමුත් ඒවාට පමණක් සීමා නොවන ගිවිසුම් නියමයන් අසාධාරණ ගිවිසුම් නියමයන් ලෙස සැලකිය යුතු ය :

i. මූල්‍ය සේවා සපයන්නා විසින් ගිවිසුමක් අවසන් කිරීමට හෝ වගන්ති වෙනස් කිරීමට පෙර සාධාරණ කාලසීමාවක් තුළ ලිඛිත ව හෝ පුවත්පත් දැන්වීම් හෝ වෙනත් සුදුසු මාධ්‍යයන් හරහා පූර්ව දැනුම් දීමකින් තොර ව ගිවිසුමක් අවසන් කිරීම හෝ වගන්ති වෙනස් කිරීම,

ii. ගිවිසුමක් වෙනස් කළ හැක්කේ කුමන තත්ත්වයන් යටතේද යන්න සඳහන් නොකර ඒකපාර්ශ්වික ව ගිවිසුමක් වෙනස් කිරීමට ඉඩ දීම,

iii. ගිවිසුම්ගත බැඳීම් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ඉටු නොකිරීමේ දී මූල්‍ය සේවා සපයන්නනාගේ වගකීම සමානුපාතික නොවන ලෙස අසාධාරණ ව සීමා කිරීම,

iv. මූල්‍ය සේවා සපයන්නා මත වන බැඳීම සමානුපාතික නොවන විට මූල්‍ය පාරිභෝගිකයා ඊට අනුරූප බැඳීම්වලට යටත් කිරීම,

v. මූල්‍ය සේවා සපයන්නකුගේ නිපැයුම් හෝ සේවා පිළිබඳ තොරතුරු වැරදි ලෙස නිරූපණය කිරීම, නොසැලකිලිමත්කම හෝ නොමග යැවීම හේතුවෙන් මූල්‍ය පාරිභෝගිකයෙකුට සිදුවන පාඩුව සම්බන්ධයෙන් මූල්‍ය සේවා සපයන්නාගේ වගකීම බැහැර කිරීම හෝ සීමා කිරීම,

vi. මූල්‍ය සේවා සපයන්නකුගේ සේවකයින්, නියෝජිතයින් හෝ මූල්‍ය සේවා සපයන්නා විසින් පත්කරන ලද තෙවන පාර්ශ්වයන් විසින් ගනු ලබන ක්‍රියාමාර්ග හෝ ඉටු කිරීමට පොරොන්දු වූ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මූල්‍ය සේවා සපයන්නාගේ වගකීම බැහැර කිරීම හෝ සීමා කිරීම,

vii. මූල්‍ය පාරිභෝගිකයාගේ අවසරයකින් තොර ව ඔහුගේ/ඇයගේ අයිතිවාසිකම් අඩුවන අයුරින්, ගිවිසුමක් යටතේ වන මූල්‍ය සේවා සපයන්නාගේ අයිතිවාසිකම් සහ වගකීම් පැවරීමේ හැකියාව මූල්‍ය සේවා සපයන්නා වෙත ලබා දීම,

viii. ගිවිසුමක් කඩවීමක දී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මූල්‍ය පාරිභෝගිකයකුට ඇති අයිතිය බැහැර කිරීම හෝ සීමා කිරීම,

ix. පනත්, නියෝග, රෙගුලාසි, චක්‍රලේඛ, මාර්ගෝපදේශ හෝ චර්යා ධර්ම සංග්‍රහ මගින් මූල්‍ය පාරිභෝගිකයින් වෙත සපයනු ලබන ඕනෑ ම ආරක්ෂාවක් අහිමි කරවන වගන්ති ඇතුළත් කිරීම.

21.2 ගිවිසුම අත්සන් කිරීමට පෙර, ගිවිසුම්ගත වීමට අදාළ සියලු ම ගිවිසුම් ලියකියවිලි මූල්‍ය සේවා සපයන්නකු විසින් මූල්‍ය පාරිභෝගිකයා වෙත සාධාරණ කාලයක් තුළ ලබා දිය යුතු ය.

**22. මූල්‍ය පාරිභෝගික වත්කම් හා සම්බන්ධ වංචා සහ අවභාවිතයන්**

22.1 මූල්‍ය ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සහ අනෙකුත් වත්කම් අභ්‍යන්තර හෝ බාහිර වංචාවන් හෝ අවභාවිතයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා සහ එවැනි වංචාවන් හෝ අවභාවිතයන් වියහැකි අවදානම් කළමනාකරණය සඳහා මූල්‍ය සේවා සපයන්නන් සතු ව ප්‍රමාණවත් ප්‍රතිපත්ති සහ ක්‍රියපටිපාටි තිබිය යුතු ය.

22.2 මූල්‍ය ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සහ අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් සැක සහිත වංචා කිරීම් සහ අවභාවිතය පිළිබඳ සිද්ධීන් විසඳීම සඳහා මූල්‍ය සේවා සපයන්නන් සතු ව පැහැදිලි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි තිබිය යුතු ය.

**23. සාධාරණ කාලයක් තුළ ප්‍රතිචාර දැක්වීම සහ මූල්‍ය පාරිභෝගිකයෙකු සම්බන්ධ කර ගැනීම**

23.1 මූල්‍ය සේවා සපයන්නෙකු මූල්‍ය පාරිභෝගිකයාගේ කැමැත්ත පරිදි, සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් සහ වඩාත් කැමති සන්නිවේදන මාර්ගයක් හරහා, ලිඛිත ව හෝ විද්‍යුත් මාර්ගයෙන්, පැහැදිලි ව සහ සාධාරණ කාලයක් තුළ මූල්‍ය පාරිභෝගිකයකුගේ තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර දැක්විය යුතු ය.

23.2 මූල්‍ය සේවා සපයන්නන් විසින් ණය ආපසු අයකර ගැනීමේ අරමුණින් මූල්‍ය පාරිභෝගික හමුවකදී, ඊට අදාළ දිනය, වේලාව, සහභාගී වූ නිලධාරීන්ගේ නම් සහ මූල්‍ය පාරිභෝගිකයාගේ ප්‍රතිචාරය (කෙටියෙන්) යන තොරතුරු සහිත සටහනක් පවත්වාගෙන යා යුතු ය.

23.3 මූල්‍ය පාරිභෝගිකයෙකු සමග දුරකථනයෙන් සම්බන්ධවීමේදී, එම සම්බන්ධවන පුද්ගලයා විසින් තමා පිළිබඳ ව තමන් නියෝජනය කරන මූල්‍ය සේවා සපයන ආයතනය හඳුන්වා දිය යුතු අතර මූල්‍ය පාරිභෝගිකයා සම්බන්ධ කර ගන්නා අරමුණ දැන්විය යුතු ය.

23.4 මූල්‍ය සේවා සපයන්නන් විසින් ඇමතුම් මධ්‍යස්ථාන සඳහා ඇමතුම් පටිගත කිරීම සහ ඇමතුම් ලේඛනයක් පවත්වාගෙන යාම කළ යුතු අතර දත්ත රඳවා ගැනීමේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් එවැනි වාර්තා රඳවා තබා ගත යුතු ය.

23.5 භෞතික අත්සනක් ලබා ගැනීමේ දී, මූල්‍ය සේවා සපයන්නන් විසින් ව්‍යාපාරික පරිශ්‍රයෙන් පිටත දී, සුරැකුම්/ගිවිසුම්ගත ලියකියවිලි සඳහා අත්සනක් ලබා ගත යුත්තේ මූල්‍ය පාරිභෝගිකයෙකුගේ ඉල්ලීම මත සාධාරණ තත්ත්වයක් පැනනැගුණහොත් පමණක් වන අතර මූල්‍ය සේවා සපයන්නාගේ බලයලත් නිලධාරියෙකු ඉදිරියේ එය සිදු කළ යුතු ය.

**24. ප්‍රචාරණය සහ විකුණුම් ප්‍රවර්ධනය**

24.1 මූල්‍ය සේවා සපයන්නන්:

i. මූල්‍ය පාරිභෝගික අවශ්‍යතා සහ හැකියා මත පදනම් ව සුදුසු මූල්‍ය නිපැයුම් හෝ සේවා ප්‍රචාරණය/ප්‍රවර්ධනය කිරීම කළ යුතු ය;
ii. මූල්‍ය පාරිභෝගිකයෙකුට අදාළ තොරතුරු හොඳින් කියවීම වැළැක්වීමේ අරමුණින් පාද සටහන්, බැහැර කිරීමේ වගන්ති හෝ සියුම් මුද්‍රණ අවභාවිත කිරීමෙන් වැළකිය යුතු ය. එවැනි අයිතම මූල්‍ය පාරිභෝගිකයෙකුට තේරුම් ගැනීමට හැකි වන පරිදි ප්‍රමාණවත් විශාලත්වයකින් සහ ප්‍රමාණවත් කාල සීමාවක් තුළ ප්‍රදර්ශනය කළ යුතු ය;
iii. වෙළෙඳ දැන්වීම් සහ විකුණුම් මෙවලම්වල නොමඟ යවන හෝ ව්‍යාජ තොරතුරු අඩංගු නොවන බව හෝ මූල්‍ය පාරිභෝගිකයාට තීරණයක් ගැනීමට වැදගත් වන තොරතුරු ඉවත් කර නොමැති බව සහතික කළ යුතු ය;
iv. වෙළෙඳ ප්‍රචාරණ සහ විකුණුම් මෙවලම්වල ඇතුළත් ප්‍රකාශයන් සඳහා වගකීම දැරිය යුතු ය;
v. මූල්‍ය පාරිභෝගිකයාගේ තත්ත්වයෙන් ප්‍රයෝජන ගනිමින් පාරිභෝගිකයෙකුට හානි කළ හැකි අලෙවිකරණ උපාය මාර්ග භාවිත නොකළ යුතු ය;
vi. මූල්‍ය පාරිභෝගිකයින්හට අලෙවිකරණ තොරතුරු ලැබීම සඳහා අවශ්‍ය පරිදි තෝරා ගැනීම සහ පසු කාලයකදී එම අලෙවිකරණ තොරතුරු ලැබීම නැවැත්වීමට පහසු ආකාර සැපයිය යුතු ය; සහ
vii. සියලු ම වෙළෙඳ දැන්වීම් සහ අලෙවිකරණ මෙවලම්වල මූල්‍ය සේවා සපයන්නාගේ ණය ශ්‍රේණිය (තිබේ නම්), සම්බන්ධ කර ගැනීමේ තොරතුරු සහ අදාළ මූල්‍ය සේවා සපයන්නා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බව ඇතුළත් කළ යුතු ය.

24.2 අලෙවිකරණය/ විකුණුම්වලට අනියුක්ත සේවකයින්ගේ සහ නියෝජිතයින්ගේ වේතනය විකුණුම් පරිමාව/ ඉලක්කය මත පමණක් පදනම් නොවිය යුතු අතර වගකීම් සහගත ව්‍යාපාරික හැසිරීම්, සහ මූල්‍ය පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා හා තත්ත්වයන් සැලකිල්ලට ගත යුතු ය.

**25. මූල්‍ය නිපැයුම්වල යෝග්‍යතාවය සහ සැලැස්ම**

25.1 මූල්‍ය සේවා සපයන්නන්:

i. මූල්‍ය පාරිභෝගිකයාට ලබාදීමට හෝ නිර්දේශ කිරීමට නියමිත මූල්‍ය නිපැයුම්(ම) හෝ සේවා(ව) එම මූල්‍ය පාරිභෝගිකයාට යෝග්‍යවන්නේදැයි නිර්ණය කිරීම සඳහා මූල්‍ය පාරිභෝගිකයා පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ සටහන් කිරීම කළ යුතු ය;
ii. මූල්‍ය නිපැයුම හෝ සේවාව හා සම්බන්ධ නියමයන් සහ කොන්දේසි සපුරාලීමට මූල්‍ය පාරිභෝගිකයාට ඇති හැකියාව තක්සේරු කළ යුතු ය;
iii. ණය තොරතුරු කාර්යාංශය (CRIB) වැනි මූලාශ්‍ර භාවිතා කරමින් මූල්‍ය පාරිභෝගිකයකුගේ අධික ණයගැතිභාවයට ඇති අවදානම තක්සේරු කිරීම සඳහා උපරිම ණය වාරිකය/ආදායම් අනුපාතය (ණය ගෙවීම සඳහා වෙන් කළ හැකි මූල්‍ය පාරිභෝගිකයාගේ වැය කළ හැකි ආදායමේ ප්‍රතිශතයක් ලෙස) හඳුනා ගත යුතු ය;
iv. ඉහත සඳහන් කළ තොරතුරු සහ නිර්ණායක මත පදනම් ව, යම් මූල්‍ය නිපැයුමකට හෝ සේවාවකට අදාළව ගිවිසුම්ගතවීමට පෙර එය මූල්‍ය පාරිභෝගිකයා සඳහා සුදුසුදැයි තීරණය කළ යුතු ය.

25.2 මූල්‍ය සේවා සපයන්නා:

i. ඉලක්කගත වෙළෙඳපොළේ ලක්ෂණ සැලකිල්ලට ගනිමින්, අපේක්ෂිත විවිධ මූල්‍ය පාරිභෝගිකයින්ගේ (ඉලක්කගත වෙළෙඳපොළ) වෙනස් වන අවශ්‍යතා, අවදානම් පැතිකඩයන් සහ අභිලාෂයන් සඳහා සුදුසු මූල්‍ය නිපැයුම් හෝ සේවාවන් ලබා දිය යුතු ය;
ii. මූල්‍ය පාරිභෝගිකයාට අවාසිදායක විය හැකි පරිදි මූල්‍ය නිපැයුම්වල ලක්ෂණ විකෘති කිරීම සඳහා මූල්‍ය නිපැයුම් වෙනස් කිරීම, එකතු කිරීම හෝ විකරණය (modify) කිරීම නොකළ යුතු ය.
iii. මූල්‍ය සේවා සපයන්නාගේ පිරිවැය ව්‍යුහය, නියාමන අවශ්‍යතා සහ වෙළෙඳපොළ මිල ගණන්/ගාස්තු/වටිනාකම් වලට සරිලන සාධාරණ මිල ගණන්/ගාස්තු/වටිනාකම් ඉදිරිපත් කළ යුතු ය.

**26. ණය, වෙනත් මූල්‍ය නිපැයුම් හෝ මූල්‍ය සේවාවක් විකිණීම හෝ පැවරීම**

ණයගැතියාගේ අනුමැතියකින් තොර ව ණය පහසුකම හෝ වෙනයම් මූල්‍ය නිපැයුමක් හෝ සේවාවක් විකිණීමට හෝ පැවරීමට නීතියෙන් අවසර දී ඇති අවස්ථාවක දී හෝ මූල්‍ය සේවා සපයන්නා මෙහෙයුම් නැවැත්වීමට, වෙනත් පාර්ශ්වයක් සමග ඒකාබද්ධ වීමට හෝ එහි මෙහෙයුම් සියල්ල හෝ කොටසක් වෙනත් පාර්ශ්වයකට පැවරීමට අපේක්ෂා කරන අවස්ථාවක දී මූල්‍ය සේවා සපයන්නා පහත ක්‍රියාමාර්ග ගත යුතු ය.

i. විකිණීමක් හෝ පැවරීමක් පිළිබඳ ව බලපෑමට ලක් වූ මූල්‍ය පාරිභෝගිකයාට සාධාරණ දින ගණනක් ඇතුළත මූල්‍ය නිපැයුමේ/සේවාවේ ඉතිරි ණය මුදල හෝ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය දැනුම් දීම;

ii. මුදල් ගෙවීම් කළ හැකි ස්ථාන පිළිබඳ තොරතුරු මූල්‍ය පාරිභෝගිකයාට ලබා දීම; සහ

iii. අත්පත් කර ගන්නා පාර්ශ්වය, ගැණුම්කරු හෝ පැවරුම්ලාභියා සම්බන්ධ කර ගත හැකි තොරතුරු, මූල්‍ය පාරිභෝගිකයාට ලබාදීම.

**27. නියෝජිතයකුගේ/මූල්‍ය සේවා සපයන්නා විසින් පත් කරන ලද තෙවන පාර්ශ්වයක හැසිරීම**

27.1 නියෝජිතයකු/තෙවන පාර්ශ්වයක් පත් කරන විට, මූල්‍ය සේවා සපයන්නෙකු විසින් එම පාර්ශ්ව සමග විධිමත් ගිවිසුමකට එළඹිය යුතු අතර එය අදාළ පරිදි මෙම රෙගුලාසිවලට අනුකූල විය යුතු ය.

27.2 මූල්‍ය සේවා සපයන්නා විසින් ඔවුන්ගේ නියෝජිතයින්/තෙවන පාර්ශ්වයන්ගේ ක්‍රියාවන් සහ අතපසුවීම් සඳහා නීත්‍යානුකූල ව වගකිව යුතු ය.

27.3 මූල්‍ය සේවා සපයන්නා විසින් ඕනෑ ම නියෝජිතයෙක් හෝ තෙවන පාර්ශ්වයක් සමග ගිවිසුම්ගතවීමට පෙර නිසි සම්ප්‍රජන්‍යතාවක් (Due diligence) කිරීම අවශ්‍ය වේ.

27.4 මූල්‍ය සේවා සපයන්නා විසින් තම නියෝජිතයින්ගේ සහ තෙවන පාර්ශ්වයන්ගේ කාර්යය සාධනය සම්බන්ධ නියාමනය අඛණ්ඩ ව සිදු කළ යුතු ය.

27.5 මූල්‍ය සේවා සපයන්නා තම මූල්‍ය පාරිභෝගිකයන්ගේ තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා වූ කාර්යය වෙනුවෙන් ඔවුන්ගේ ව්‍යාපාරවල යොදවා ඇති නියෝජිතයන්/තෙවන පාර්ශ්වයන් සමග තොරතුරු අනාවරණය නොකිරීමේ ගිවිසුමකට එළඹිය යුතු ය.

27.6 මූල්‍ය සේවා සපයන්නා විසින් මූල්‍ය පාරිභෝගික සේවා කටයුතු සඳහා පත් කර ඇති නියෝජිතයින්ගේ සහ තෙවන පාර්ශ්වයන්ගේ විස්තර සහ පහත සඳහන් ඒවාට පමණක් සීමා නොවී ඒවා කිරීමෙන් වැළකී සිටීමට අදාළව නිකුත් කර ඇති චර්යා ධර්ම සංග්‍රහයන් මූල්‍ය පාරිභෝගිකයන්ගේ ඉල්ලීම මත ලබා දිය යුතු ය.

i. මූල්‍ය පාරිභෝගිකයින්ට හිරිහැර කිරීම;

ii. මූල්‍ය පාරිභෝගික තොරතුරු අවසර නොලත් පාර්ශ්වයන්ට හෙළිදරව් කිරීම;

iii. මූල්‍ය නිපැයුම් හෝ මූල්‍ය සේවාවන් පිළිබඳ අසත්‍ය හෝ නොමග යවන තොරතුරු ලබා දීම; සහ

iv. මූල්‍ය සේවා සැපයුම්කරුගේ මූල්‍ය නිපැයුම්/සේවා මිලදී ගැනීමට හෝ ඒවාට සම්බන්ධ වීමට මූල්‍ය පාරිභෝගිකයින්ට හෝ සාමාන්‍ය ජනතාවට අයුතු බලපෑම් කිරීම.

**28. ණය අයකර ගැනීම**

28.1 මූල්‍ය සේවා සපයන්නා ණය අයකර ගැනීමේ ක්‍රියාවලීන් විනිවිදභාවයෙන් යුතුව, සාධාරණ ව සහ ආචාරශීලීව මෙන්ම, මූල්‍ය පාරිභෝගිකයා වෙත අනිසි පීඩනයන් ඇති කිරීම්, බිය ගැන්වීම්වලින්, හිරිහැරයන්ගෙන්, අවමානයන්ගෙන් හෝ තර්ජනයන්ගෙන් තොර ව සිදු කරන බව තහවුරු කළ යුතු ය.

28.2 මූල්‍ය සේවා සපයන්නා විසින් ණය පහසුකමට අදාළව අත්පත් කරගත් වත්කම් විකුණා ලැබෙන මුදල්, එම ණය පහසුකම අයකර ගැනීම සඳහා කඩිනමින් යොදා ගත යුතු අතර ඒ පිළිබඳ ව මූල්‍ය පාරිභෝගිකයා දැනුවත් කර යම් ඉතිරි මුදලක් වෙතොත් අදාල නීති විධිවිධානයන්ට යටත් ව එය ආපසුගෙවා දැමිය යුතු ය. තවද, මූල්‍ය සේවා සපයන්නා විසින් සුරැකුම් විකිණීමේ වාර්තාවක්, හිමිකම පැවරීමේ/විකිණීමේ දින සිට සාධාරණ කාලසීමාවක් තුළ මූල්‍ය පාරිභෝගිකයා වෙත ලබා දිය යුතු අතර එහි ක්‍රියාදාමය, සමස්ත විකුණුම් ආදායම, ඊට අදාළ සියලු ම ආනුශංගික වියදම්/පිරිවැය සහ ශුද්ධ අදායම යන තොරතුරු ඇතුළත් විය අතර ඒවාට පමණක් සීමා නොවිය යුතු ය.

28.3 මූල්‍ය සේවා සපයන්නා පහත සඳහන් කටයුතු වල නිරත නොවිය යුතු ය.

i. රැකියා තනතුර හා තත්ත්වය, දුරකථන අංක හෝ ලිපිනය සම්බන්ධ තොරතුරු තහවුරු කිරීමේ දී හැර මූල්‍ය පාරිභෝගිකයාගේ මිතුරන්, සේවායෝජකයා, ඥාතීන් හෝ අසල්වැසියන්, පහත අවස්ථාවන්හිදී හැර තොරතුරු ලබා ගැනීමට සම්බන්ධ කර ගැනීම.

අ) ණය පහසුකමට අදාළව ඇප සහතික කර ඇත්නම්; හෝ

ආ) මූල්‍ය පාරිභෝගිකයා විසින් අවශ්‍ය වූ විට සම්බන්ධ කර ගැනීමට නම් කර ඇත්නම්.

ii. යම් පුද්ගලයකු ඇපකරුවෙකු ලෙස ක්‍රියා කර ඇති අවස්ථාවේ දී හැර, ඉහත (i) හි සඳහන් කර ඇති ඕනෑ ම පුද්ගලයකු ණය හිලව් කර ගැනීමට යොදා ගැනීම.

iii. අවස්ථාවට නොගැලපෙන සේ පුද්ගලයකු සමග අනවශ්‍ය හෝ අධික ලෙස සම්බන්ධ කර ගැනීම හෝ සන්නිවේදන කටයුතු පැවැත්වීම.

iv. තෙවන පාර්ශ්වයකට (මිතුරන්, පවුලේ අය ආදිය ඇතුළු ව) ණයක් ලබාගෙන ඇති බව හෙළිදරව් කිරීම.

v. ණයක් සම්බන්ධයෙන් එහි ස්වභාවය, ගෙවිය යුතු මුදල, මූල්‍ය සේවා සපයන්නාගේ නෛතික අයිතිවාසිකම් හෝ ණය නොගෙවන්නේ නම් පුද්ගලයකුට ඇතිවිය හැකි නෛතික ප්‍රතිවිපාක වැනි කරුණු සම්බන්ධයෙන් ඕනෑ ම වැරදි අර්ථ නිරූපණයන් ඉදිරිපත් කිරීම.

vi. ප්‍රසිද්ධියේ ලැජ්ජාවට පත් කිරීම.

vii. මූල්‍ය පාරිභෝගිකයාගේ පූර්ව අවසරයකින් තොර ව ණය අයකර ගැනීම සඳහා පුද්ගලයකුගේ රැකියා ස්ථානයට ඇමතීම හෝ පැමිණීම.

viii. ඕනෑ ම පුද්ගලයකුට හානියක් කිරීම හෝ හානි කිරීමට තර්ජනය කිරීම.

ix. සුරැකුම් ලෙස තබා නොමැති දේපළ අත්පත් කර ගැනීම හෝ අත්පත් කර ගැනීමට තර්ජනය කිරීම.

x. දේපළවලට හානි කිරීම හෝ හානි කිරීමට තර්ජනය කිරීම.

xi. මූල්‍ය පාරිභෝගිකයාගේ පූර්ව ස්වේච්ඡා අවසරය ඇතිව හැර, ණය අයකර ගැනීමේ අරමුණින් ප.ව 9.00 සිට පෙ.ව. 6.00 දක්වා කාලය තුළ මූල්‍ය පාරිභෝගිකයන් පෞද්ගලික ව හමුවීම හෝ දුරකථන මාධ්‍ය වැනි වෙනත් මාධ්‍යවලින් සම්බන්ධ කර ගැනීම.

**29. නිදහස් වෙළෙඳපොළ**

29.1 මූල්‍ය සේවා සපයන්නා

i. වෙනත් මූල්‍ය සේවා සපයන්නන් වෙළෙඳපොළට ප්‍රවේශ වීමට බාධා කරමින් නියෝජිතයින් සහ වෙළෙන්දන් සමග සුවිශේෂී වැඩපිළිවෙල සඳහා යොමු නොවිය යුතු ය; සහ

ii. විවෘත සහ අන්තර් ක්‍රියාකාරී පද්ධති ක්‍රියාත්මක කළ යුතු ය.

29.2 මූල්‍ය සේවා සපයන්නා

i. ව්‍යාපාර බලපත්‍රය, මහ බැංකුවෙන් ලබාගත් ලියාපදිංචිය හෝ පත් කිරීම, විගණනය කරන ලද නවතම මූල්‍ය ප්‍රකාශන, පාදක වූ පිරිවිතර සහිත ව ණය ශ්‍රේණිගත කිරීම, පැමිණිලි හසුරුවන ප්‍රධාන පුද්ගලයා සම්බන්ධ කරගත හැකි තොරතුරු, ව්‍යාපාරික වේලාවන් සහ නිවාඩු දින සම්බන්ධ නිවේදන මූල්‍ය සේවා සපයන්නාගේ සේවා ස්ථාන ඇතුළු ව්‍යාපාරික ස්ථානවල, ප්‍රමුඛ ව දර්ශනය වන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

ii. තැන්පතු සහ ණය සේවාවල වත්මන් වාර්ෂික සඵල සහ නාමික පොළී අනුපාත, විදේශ විනිමය අනුපාත, ගාස්තු පිළිබඳ විස්තර, කොමිස් සහ වෙනත් ගාස්තු සම්බන්ධ විස්තර බලාත්මක වන දිනයද ඇතුළත් ව මූල්‍ය සේවා සපයන්නාගේ නිල වෙබ් අඩවියේ සහ ශාඛා/ බැංකු සේවා ස්ථාන ඇතුළු ව සියලු ම ව්‍යාපාරික ස්ථානවල ප්‍රමුඛ ව දර්ශනය වන ස්ථානයක ප්‍රකාශයට පත් කළ යුතු ය.

**30. මූල්‍ය පාරිභෝගික අධ්‍යාපනය සහ දැනුවත් කිරීම්**

30.1 මූල්‍ය අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

i. මූල්‍ය සේවා සපයන්නා තමන් විසින් ම හෝ මූල්‍ය ක්ෂේත්‍රයේ අනෙකුත් සංගම් සමග හවුල් ව හෝ මහ බැංකුව හෝ මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කරන නියෝජිතායතන සමග සහයෝගයෙන්, ප්‍රමාණවත් මූල්‍ය අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රමවේද සකස්කර ක්‍රියාත්මක කළ යුතු ය.

ii. මූල්‍ය අධ්‍යාපන මෙවලම්වලට මුද්‍රිත අත් පත්‍රිකා, පත්‍රිකා, ග්‍රන්ථක, පෝස්ටර, වීඩියෝ, අන්තර් ක්‍රියාකාරී ණය ගණක යන්ත්‍ර, මූලික පණිවිඩ යනාදිය ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

iii. මූල්‍ය සේවා සපයන්නා විසින් මූල්‍ය නිපැයුම/සේවාව සම්බන්ධයෙන් අදාළවන නීතිමය ප්‍රතිපාදන පිළිබඳ ව මූල්‍ය පාරිභෝගිකයන් දැනුවත් කළ යුතු ය.

30.2 මූල්‍ය සේවා සපයන්නන් විසින් මූල්‍ය අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් යොදාගනිමින්, අවදානමට ලක්විය හැකි මූල්‍ය පාරිභෝගික කණ්ඩායම් සඳහා විශේෂ අවධානය යොමු කරමින්, බහු ණය ගැනීම් සහ ආපසු ගෙවීම් ප්‍රමාද වීමේ ප්‍රතිවිපාක ඇතුළු අධික ණයගැතිභාවය සම්බන්ධයෙන් විශේෂ අනතුරු ඇඟවීම් මූල්‍ය පාරිභෝගිකයින්හට ලබා දිය යුතු ය.

**හෙළිදරව් කිරීම හා විනිවිදභාවය**

31. මූල්‍ය සේවා සපයන්නන් නිල වෙබ් අඩවියක් පවත්වාගෙන යා යුතු අතර එහි අන්තර්ගතය තම ව්‍යාපාර කටයුතු, එහි නිපැයුම් සහ සේවා පිළිබඳ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සහ විනිවිදභාවය තහවුරු වන පරිදි නිරන්තරයෙන් යාවත්කාලීන කළ යුතු ය.

32. මූල්‍ය සේවා සපයන්නකු ගිවිසුමෙහි ඕනෑ ම අදියරක දී සියලු ම අදාළ තොරතුරු සහ ලේඛන මූල්‍ය පාරිභෝගිකයින් වෙත ඔවුන්ගේ අභිමතය පරිදි සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවකින් සරලව සම්පූර්ණ, පැහැදිලි, සංක්ෂිප්ත, නිවැරදි, නොමඟනොයවන සුළු ලෙස සහ සාධාරණ කාලයක් තුළ හෙළිදරව් කිරීම හෝ ලබා දීම සිදුකළ යුතු අතර එවැනි තොරතුරුවල වැදගත් ලක්ෂණ මූල්‍ය පාරිභෝගිකයාහට පැහැදිලි කර දිය යුතු ය.

33. මූල්‍ය පාරිභෝගිකයින් වෙත මූල්‍ය සේවා සම්බන්ධයෙන් වන අර්පණ ලිපිය, ගිවිසුම සහ වෙනත් අදාළ නෛතික ලේඛනයන්හි පිටපත්, නීතිමය වශයෙන් තොරතුරුවල පරිපූර්ණභාවයට ඇති අවශ්‍යතාවට අවධානය යොමු කරමින්, එම ලේඛන ක්‍රියාත්මක කරන අවස්ථාවේ දී හෝ සාධාරණ කාලයක් තුළ ලබා දිය යුතු ය.

34. **මූල්‍ය නිපැයුම් හා සේවාවන් පිළිබඳ තොරතුරු**

34.1 මූල්‍ය සේවා සපයන්නා විසින් වෙළෙඳ දැන්වීම්, අලෙවිකරණ ලේඛන හෝ ඕනෑ ම මාධ්‍යයකදී මූල්‍ය නිපැයුම් හෝ සේවාවන්ට අදාළ නිවැරදි සහ නොමඟ නොයවන සුළු තොරතුරු (ලිඛිත, වාචික හෝ දෘශ්‍ය වශයෙන්) සැපයිය යුතු ය.

34.2 සපයනු ලබන තොරතුරු, සරල, පැහැදිලි සහ තේරුම් ගත හැකි ආකාරයෙන් මූල්‍ය පාරිභෝගිකයා කැමති භාෂාවකින් එනම් සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා අතුරින් එක් භාෂාවකින් විය යුතු ය.

34.3 මූල්‍ය සේවා සපයන්නකු විසින් සපයනු ලබන ඕනෑ ම ලිඛිත සන්නිවේදනයක;

i. අන්තර්ගතය මූල්‍ය පාරිභෝගිකයාට පහසුවෙන් කියවිය හැකි ලෙස සුදුසු අකුරු, ප්‍රමාණයන්, පරතරය සහ ස්ථානගත කිරීම්වලින් යුක්ත විය යුතු ය.

ii. වාර්ෂික සඵල පොළී අනුපාතිකය, පහසුකම්වල කාලසීමාව, ගාස්තු හා අයකිරීම් සහ ප්‍රධාන අවදානම් වැනි මූල්‍ය නිපැයුම් සහ සේවාවන්හි ප්‍රධාන අංග විශේෂයෙන් ඉස්මතු වන ලෙස අඩංගු විය යුතු ය.

34.4 මූල්‍ය සේවා සපයන්නකු මූල්‍ය සේවාවන්ට අදාළ මූලික තොරතුරු ලේඛනය, අයදුම්පත්, අර්පණ ලිපි, ගිවිසුම්, ආකෘති පත්‍ර, ලදුපත් සහ ප්‍රකාශන ඇතුළු ලිපි ලේඛන මූල්‍ය පාරිභෝගිකයෙකුට, විද්‍යුත් ක්‍රමවේදයන් ද ඇතුළත් ව, ලිඛිත ආකාරයෙන් ලබා දිය යුතු ය.

34.5 මූල්‍ය සේවා සපයන්නන් විසින් හෙළිදරව් කරන ලද හෝ ලබාදුන් තොරතුරු පිළිබඳ ව මූල්‍ය පාරිභෝගිකයින්ට ගැටලු පවතීනම් පැහැදිලි කිරීම් ලබා දිය යුතු ය.

34.6 අර්පණය පිළිගැනීමට පෙර මූල්‍ය නිපැයුම් හෝ සේවාවන්හි තොරතුරු සහ ඒවායේ නියමයන් සහ කොන්දේසි පිළිබඳ විස්තර ලැබුණු බවට, පැහැදිලි කර දුන් බවට සහ අවබෝධ කර ගත් බවට මූල්‍ය පාරිභෝගිකයාගෙන් ලිඛිත තහවුරු කිරීමක් මූල්‍ය සේවා සපයන්නන් විසින් ලබා ගත යුතු ය.

34.7 මූල්‍ය සේවා සපයන්නන් අවම වශයෙන් ලිත් දින තිහකට (30) පෙර තමන් සපයනු ලබන සේවාවන්හි සංශෝධන හෝ වෙනස් කිරීම් පිළිබඳ ව ඉන් බලපෑමට ලක් වන මූල්‍ය පාරිභෝගිකයින්ට දැනුම් දිය යුතු ය.

34.8 මූල්‍ය සේවා සපයන්නන් ඩිජිටල් මාධ්‍ය මගින් පැහැදිලි සහ විනිවිදභාවයකින් තොරතුරු ලබා දිය යුතු අතර මූල්‍ය සේවා සපයන්නන්;

i. වැඩි විස්තර ඇතුළත් ද්විතීයික තොරතුරු සමගින්, ප්‍රධාන තොරතුරු ඩිජිටල් මාධ්‍යයන්හි ප්‍රමුඛ ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය වේ.

ii. වැඩිදුර තොරතුරු සහ සහාය ලබා ගැනීම සඳහා මාර්ගගත නොවන මාධ්‍ය ලබා දීමට අවශ්‍ය වේ.

iii. විනිවිදභාවය සහ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා ජංගම මාධ්‍ය ඔස්සේ සපයනු ලබන තොරතුරුවල අනුපිළිවෙළ සහ ප්‍රවාහය පවත්වා ගැනීම අවශ්‍ය වේ.

iv. ඩිජිටල් ගනුදෙනු ක්‍රියාවලියේ දී ගනුදෙනුව සම්පූර්ණ කිරීමට පෙර මිල නියම කිරීම සහ ප්‍රධාන නියමයන් හා කොන්දේසි හෙළිදරව් කිරීමට අවශ්‍ය වේ.

v. ප්‍රමාණවත් ආරක්ෂිත ලක්ෂණ සහිත ව භාවිතයට හිතකාමී සහ සැරිසැරීමට පහසු වන ලෙස ජංගම යෙදවුම්/ මාධ්‍ය හරහා පරිශීලක අතුරුමුහුණත් ලබා දීමට අවශ්‍ය වේ.

35. **මූලික තොරතුරු ලේඛනය**

35.1 මූල්‍ය සේවා සපයන්නන් සතු ව එහි මූල්‍ය නිපැයුම්/ සේවා සඳහා මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයෙන් "මූලික තොරතුරු ලේඛනයක්" ආකාරයෙන් ප්‍රමිතිගත ලේඛනයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් සරල භාෂා ශෛලියකින් ලියා තිබිය යුතු අතර, ඒවා අනාගත මූල්‍ය පාරිභෝගිකයින්ට ලබා ගත හැකි ආකාරයෙන් ආයතනික වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කළ යුතු ය.

35.2 මූලික තොරතුරු ලේඛනයෙහි ණය පහසුකම් සම්බන්ධයෙන් පහත මූලික තොරතුරු අඩංගු විය යුතු ය.

i. මූල්‍ය නිපැයුමෙහි ස්වභාවය, වාර්ෂික සඵල පොළී අනුපාතය, දඩ, වෙනත් ගාස්තු සහ අයකිරීම් සහ කොමිස් ඇතුළු මූල්‍ය සේවාවන්හි ප්‍රධාන ලක්ෂණ

ii. මූල්‍ය නිපැයුම්/ සේවාවන් ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටීන්

iii. ප්‍රධාන නියමයන් හා කොන්දේසි

iv. පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය

35.3 මෙම ලේඛනයෙහි තැන්පතු නිපැයුම් සම්බන්ධයෙන් පහත මූලික තොරතුරු අඩංගු විය යුතු ය.

i. මූල්‍ය නිපැයුමෙහි ස්වභාවය, වාර්ෂික සඵල පොළී අනුපාතය, දිරිගැන්වීම් සහ ප්‍රවර්ධනයන් ඇතුළු ව මූල්‍ය පාරිභෝගිකයින් සඳහා වන මූල්‍ය සහ අනෙකුත් ප්‍රතිලාභ ඇතුළු මූල්‍ය සේවාවන්හි ප්‍රධාන ලක්ෂණ

ii. පවත්වාගත යුතු අවම ශේෂ අවශ්‍යතා, ගිණුම් විවෘත කිරීමේ ගාස්තු, ගිණුම් පවත්වා ගැනීමේ ගාස්තු, ගිණුම් වසා දැමීමේ ගාස්තු සහ තැන්පතු රක්ෂණය සහ එහි ආවරණය

iii. ගිණුම් විවෘත කිරීම, ගිණුම් වසා දැමීම, කල් පිරීමට පෙර ප්‍රථම මුදල් ලබා ගැනීම, ගනුදෙනුකරුවන් විසින් මුදල් මාරු කිරීම්වලට අදාළ සීමාවන් සහ අක්‍රීය ගිණුම් සහ අතහැර දැමූ දේපල පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි

iv. පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය

v. අනවසර හෝ වැරදීමෙන් සිදුවන ගනුදෙනු සඳහා ක්‍රියාපටිපාටිය

**36. නියමයන් හා කොන්දේසි හෙළිදරව් කිරීම**

මූල්‍ය සේවා සපයන්නන් විසින් මූල්‍ය පරිභෝගිකයින් හට මූල්‍ය නිපැයුම/ සේවාවන්වලට අදාළව සියලු නියමයන් සහ කොන්දේසි ඇතුළත් ව ගිවිසුම් ලබා දිය යුතු අතර, එහි පහත, නමුත් ඒවාට පමණක් සීමා නොවූ, කරුණු අඩංගු විය යුතු ය.

i. මූල්‍ය පාරිභෝගිකයාගේ අයිතිවාසිකම් සහ වගකීම්

ii. මූල්‍ය සේවා සපයන්නාගේ අයිතිවාසිකම් සහ වගකීම්

iii. මූල්‍ය පාරිභෝගිකයාට ඇති ප්‍රධාන අවදානම්

iv. මූල්‍ය නිපැයුමට/ සේවාවට අදාළ පොළී අනුපාත, පිරිවැය, කොමිස්, ගාස්තු සහ අයකිරීම්

v. පොළී අයකිරීම් ගණනය කරන ක්‍රමය

vi. ගිවිසුමේ වෙනස්කම් පිළිබඳ ව මූල්‍ය පාරිභෝගිකයින්ට දැනුම් දීම

vii. ගිවිසුමක් කඩ කිරීමක දී දඩුවම් සහ වෙනත් පිළියම්

viii. මූල්‍ය සේවා සපයන්නාගේ මූල්‍ය පාරිභෝගික සේවා සම්බන්ධතා තොරතුරු

ix. ගිවිසුම අවසන් කිරීමට හේතු විය හැකි නියමයන් සහ කොන්දේසි

x. මූල්‍ය නිපැයුම්/සේවාවන් අවලංගු කිරීම/අවසන් කිරීම/වෙනත් මූල්‍ය සේවා සපයන්නෙකු වෙත රැගෙන යාම සම්බන්ධ ක්‍රියාපටිපාටි

xi. මූල්‍ය පාරිභෝගිකයා විසින් මූල්‍ය සේවාවක් කල් පිරීමට පෙර මුදල් ආපසු ගැනීමක දී හෝ ගිවිසුම අවසන් කිරීමකදී/ පහසුකමක් කලින් පියවා අවසන් කිරීමක දී/ මූල්‍ය නිපැයුම මාරු කිරීමක දී අදාළ වන යම් වන්දි/ගාස්තු/ දණ්ඩනයන්

xii. පැමිණිලි හැසිරවීම සඳහා මූල්‍ය සේවා සපයන්නන්ගේ පවතින ක්‍රියා පටිපාටිය සහ ඒ හා සම්බන්ධ නවතම සම්බන්ධතා තොරතුරු සහ ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුඩ්ස්මන් සහ මහ බැංකුව වැනි විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන්

xiii. පහත නියමයන් සම්බන්ධ කරුණු

අ) සැක කටයුතු ගනුදෙනු සහ නියමිත සීමාවට වඩා වැඩි ගනුදෙනු මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කිරීම

ආ) සොරකම් කරන ලද කාඩ්පත්/මූල්‍ය උපකරණ සම්බන්ධයෙන් මූල්‍ය පාරිභෝගිකයා විසින් අනුගමනය කළ යුතු පැමිණිලි කිරීමේ ක්‍රියා පටිපාටි සහ එම වගකීම මූල්‍ය සේවා සපයන්නා සහ මූල්‍ය පාරිභෝගිකයා විසින් භාරගනු ලබන ආකාරය

xiv. මූල්‍ය පාරිභෝගික තොරතුරු ලබා ගැනීමට නීත්‍යානුකූලව බලයලත් පාර්ශ්වයකට එවැනි තොරතුරු හෙළිදරව් කිරීම.

**37. ණය පහසුකම් සහ ණය උපකරණ සඳහා තොරතුරු**

37.1 මූල්‍ය සේවා සපයන්නා විසින් ණය පහසුකම් සම්බන්ධයෙන් මූල්‍ය පාරිභෝගිකයා වෙත අයදුම්පතක්/ අර්පණ ලිපියක්/ ගිවිසුමක් ලබා දිය යුතු අතර, එම අයදුම්පත/ අර්පණ ලිපිය/ ගිවිසුම තුළ **රෙගුලාසි 34** හි සඳහන් වන තොරතුරුවලට අමතරව අවම වශයෙන් පහත මූලික තොරතුරු අඩංගු විය යුතු ය.

i. ණය ගැනුම්කරුගේ නම
ii. ගිවිසුම් අංකය (ණය යොමු අංකය)
iii. ලබා දුන් මුදල
iv. ලබා දුන් දිනය සහ ණය ආපසු ගෙවීමේ කාලය
v. සඵල පොළී අනුපාතිකය සහ පොළී පදනම (ස්ථාවර හෝ විචල්‍ය)
vi. විචල්‍ය පොළී අනුපාතිකයක් නම්, පදනම් අනුපාතිකය සහ පොළී අනුපාතික සංශෝධන වන වාර ගණන
vii. ආපසු ගෙවීමේ සැලැස්ම සහ වාරිකයක නැවත ගෙවන කාල පරාසය (දෛනික ව, සතිපතා, මාසික ව හෝ වෙනත් පදනමක් ඇත්නම් ඒ සම්බන්ධ ව)
viii. පිරිනමනු ලබන සුරැකුම/ ඇපකරය පිළිබඳ විස්තර
ix. රක්ෂණය, තක්සේරු කිරීම, ලියකියවිලි, ලියාපදිංචිය යනාදී මූල්‍ය පාරිභෝගිකයා විසින් ගෙවිය යුතු අමතර ගාස්තු, කොමිස් සහ අනෙකුත් වියදම් පිළිබඳ විස්තරාත්මක ගණනය කිරීම් (අදාළ වන පරිදි)
x. ගෙවීම් ප්‍රමාද වූ අවස්ථාවක ඒ සඳහා අය කරනු ලබන වාර්ෂික දඩ පොළී අනුපාතිකය
xi. මූල්‍ය පාරිභෝගිකයා විසින් ගෙවීම් පැහැර හරින අවස්ථාවක දී වත්කම් නැවත අත්පත් කර ගැනීමට අදාළ කාලය සහ වියදම් වර්ග ඇතුළු ව අයකර ගැනීමේ ක්‍රියාපටිපාටිය, වත්කම් නැවත අත්පත් කර ගැනීමෙන් පසු මූල්‍ය පාරිභෝගිකයා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය, අදාළ වන වෙනත් ගාස්තු වර්ග ආදිය
xii. මූල්‍ය පාරිභෝගිකයා විසින් ණය උපකරණයක් මත ගෙවීම අවලංගු කිරීමට හෝ නැවැත්වීමට අදාළ ක්‍රියාපටිපාටි
xiii. තම ගිණුම්වල අනවසර ගනුදෙනු හෝ ණය උපකරණ සම්බන්ධ වංචාවක දී එක් එක් පාර්ශ්වයන්ගේ වගකීම
xiv. ණය උපකරණයකට අදාළ ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් නොමැති අවස්ථාවක දී මූල්‍ය පාරිභෝගිකයාට ඇති වන ප්‍රතිවිපාක සහ පිරිවැය
xv. ණය පහසුකම සමග එකට බැඳ හෝ ඈඳා විකුණනු ලබන සියලු ම මූල්‍ය නිපැයුම් හෝ සේවාවන්ට අදාළ නියමයන් සහ කොන්දේසි
xvi. මූල්‍ය පාරිභෝගිකයා විසින් මූල්‍ය පහසුකම කලින් පියවීමේ දී අදාළ කොන්දේසි

37.2 මෙම රෙගුලාසියෙහි අරමුණ සඳහා, 'ණය උපකරණ ' යන්නට කාසි සහ නෝට්ටු හැර චෙක්පත්, ණයවර ලිපි, පොරොන්දු පත්‍ර යනාදිය ණය ගැනීමක දී සාක්ෂි ලෙස ක්‍රියා කරන වෙනත් ලියවිල්ලක් ඇතුළත් වේ.

**38. ගිණුම් ප්‍රකාශන ලබාදීම**

38.1 මූල්‍ය සේවා සපයන්නන් විසින් පහත සඳහන් ලේඛන සහ තොරතුරු මූල්‍ය පාරිභෝගිකයෙකු වෙත ලබා දිය යුතු ය:

i. මූල්‍ය සේවා සපයන්නා මූල්‍ය පාරිභෝගිකයා වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන සෑම ගිණුමක ම කාලීන ප්‍රකාශනයක් නොමිලේ ලිඛිත ව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් මූල්‍ය පාරිභෝගිකයා විසින් මූල්‍ය සේවා සපයන්නා සමග මූලික ගිවිසුමට එළඹෙන අවස්ථාවේ දී එකඟ වූ පරිදි;
ii. ගිවිසුමක් අවලංගු කිරීමේ දී හෝ අවසන් කිරීමේ දී ගිණුම අවසන් කිරීමේ ප්‍රකාශනයක්; සහ
iii. මූල්‍ය පාරිභෝගිකයාගේ ඉල්ලීම මත ගිණුම් ශේෂයන් පිළිබඳ තොරතුරු.

38.2 ගිණුම් ප්‍රකාශන ලබා දීමේ වාර ගණන, මූල්‍ය නිපැයුම් හා සේවා වර්ගය, ඒවායේ කාල සීමාව සහ මූල්‍ය පාරිභෝගිකයන්ට අනුරූප වේ.

38.3 **උප රෙගුලාසි 38.1 (i) සහ (ii)** යටතේ සඳහන් කර ඇති ප්‍රකානශයේ පහත තොරතුරු අදාළ වන පරිදි අඩංගු විය යුතු ය:

i. සියලු ම ගනුදෙනු (දිනය, වර්ගය සහ වටිනාකම);
ii. ආරම්භක හා අවසාන ශේෂයන්;
iii. ගෙවිය යුතු දිනය;
iv. ගෙවිය යුතු මුදල;
v. වාර්ෂික සඵල පොළී අනුපාතිකය; සහ
vi. අය කරන ලද ගාස්තු සහ දඩ මුදල් (අනුපාතය හෝ ප්‍රතිශතය)

**39. වගකීම් පියවීම**

39.1 මූල්‍ය සේවා සපයන්නන් මූල්‍ය වගකීම් සම්පූර්ණයෙන් ගෙවා දමා ඇති මූල්‍ය පාරිභෝගිකයෙකුට වගකීම සම්පූර්ණයෙන් පියවූ බව සඳහන් ලිඛිත ප්‍රකාශනයක් ලබා දිය යුතු ය.

39.2 මූල්‍ය සේවා සපයන්නන් විසින්, ණය පහසුකමක ඇපයට තබාගත් දේපළ සම්බන්ධ ලිපි ලේඛන ඊට අදාළ වගකීම් සම්පූර්ණයෙන් ම නිමකළ දිනයේ සිට වැඩ කරන දින හතක් (07) ඇතුළත මූල්‍ය පාරිභෝගිකයා වෙත නිදහස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු ය.

40. තැන්පතු ගිණුම් පිළිබඳ තොරතුරු

මූල්‍ය සේවා සපයන්නන් **රෙගුලාසි 34**හි සඳහන් තොරතුරුවලට අමතර ව අයදුම්පතේ / මැන්ඩේටයේ/ සහතිකයේ/ පාස්පොතේ/ අලුත් කිරීමේ නිවේදනයේ, පහත කරුණුවලට අදාළ තොරතුරු මූල්‍ය පාරිභෝගිකයාට හෙළිදරව් කළ යුතු ය:

i. ගිණුමේ ශේෂය (මෙය සුදුසු මාධ්‍යයකින් සුදුසු වාර ගණනක දී අදාළ පරිදි ලබා දිය යුතු ය);

ii. අදාළ වාර්ෂික සඵල පොළී අනුපාතිකය/ ඵලදා අනුපාතය/ ලාභ බෙදීමේ අනුපාතය;

iii. ගිණුම් විවෘත කිරීම සහ අවම ශේෂයන් සඳහා අදාළ ගාස්තු හෝ අයකිරීම්;

iv. ගිණුම් පවත්වාගෙන යාමේ ගාස්තු;

v. පෞද්ගලික හැඳුනුම් අංක සහ ගිණුමට සම්බන්ධ මුරපද ඇතුළු ව පෞද්ගලික තොරතුරු රහසිගත ව තබා ගැනීම සම්බන්ධයෙන් මූල්‍ය පාරිභෝගිකයාගේ වගකීම;

vi. ගාස්තුවකින් තොර ව ගනුදෙනු හා මුදල් ආපසු ගැනීම් සිදු කළ හැකි වාර ගණන වැනි ගිණුමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධ සීමා කිරීම්;

vii. කාලීන තැන්පතු සම්බන්ධයෙන්, කල් පිරෙන දිනට පෙර තැන්පතුව අළුත් කිරීම පිළිබඳ දැනුම් දීම;

viii. තැන්පතු රක්ෂණය සහ එහි ආවරණය;

ix. ගිණුම වසා දැමීමට අදාළ ක්‍රියාපටිපාටිය හා මූල්‍ය පාරිභෝගිකයාට දැරීමට සිදුවන පිරිවැය; සහ

x. අක්‍රීය හෝ අකර්මණ්‍ය ගිණුමක් වශයෙන් වර්ගීකරණයට අදාළ කොන්දේසි හා අක්‍රීයවීමේ හෝ අකර්මණ්‍යවීමේ ප්‍රතිවිපාක.

41. නියමයන් සහ කොන්දේසිවල වෙනස්වීම් පිළිබඳ දැනුම්දීම

41.1 පහත කරුණු සම්බන්ධයෙන් එකඟ වූ නියමයන් සහ කොන්දේසි වෙනස් කිරීමට පෙර, මූල්‍ය සේවා සපයන්නා විසින් සාධාරණ කාලයක් තුළ ලිඛිත ව මූල්‍ය පාරිභෝගිකයාට දැනුම් දිය යුතු ය:

i. මූල්‍ය පාරිභෝගිකයාගේ කිසියම් ගිණුමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු හෝ අය විය යුතු වාර්ෂික සඵල පොළී අනුපාතිකය;

ii. මූල්‍ය පාරිභෝගිකයාගේ ඕනෑ ම ගිණුමක් මත අය කරන පොළී නොවන ඕනෑ ම ගාස්තුවක්; සහ

iii. අවලංගු කිරීමේ ක්‍රියාපටිපාටිය, ණය පෙර ගෙවුම් සිදු කිරීම සහ ණය ආපසු ගෙවීම පැවරීම වැනි වෙනත් ප්‍රධාන නිපැයුම්/සේවා අංගයන් සම්බන්ධයෙන් පෙර එකඟ වූ නියමයන් හෝ කොන්දේසි.

41.2 ඔහුගේ/ඇයගේ ගනුදෙනු කරන ගිණුම් අක්‍රීය හෝ අකර්මණ්‍යවී ඇති විට මූල්‍ය සේවා සපයන්නා විසින් මූල්‍ය පාරිභෝගිකයාට දැනුම් දිය යුතු ය.

පැමිණිලි හැසිරවීම සහ සහන සැලසීමේ යාන්ත්‍රණය

42. ප්‍රතිපත්තිය සහ ක්‍රියාපටිපාටි

42.1 මූල්‍ය සේවා සපයන්නාට, තම මූල්‍ය පාරිභෝගිකයින්ගේ දුක්ගැනවිලි සහ පැමිණිලි සම්බන්ධ වාර්තා පවත්වාගෙන යාම ඇතුළු ව ඒවා භාර ගැනීමට, සාධාරණ සහනයක් සමග නිරාකරණයට, වන්දි ගෙවීමට සහ එම දුක්ගැනවිලි සහ පැමිණිලි සම්බන්ධයෙන් සෑම මූල්‍ය පාරිභෝගිකයෙකුට ම ප්‍රතිචාර දැක්වීම යන කරුණු සම්බන්ධයෙන් සුදුසු යාන්ත්‍රණයන් ඇති බව තහවුරු කිරීම සඳහා පැහැදිලි, ලිඛිත ප්‍රතිපත්තියක් සහ ක්‍රියාපටිපාටීන් තිබිය යුතු ය.

42.2 සෑම මූල්‍ය සේවා සපයන්නෙකු විසින් ම පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණයක් හෝ ඒකකයක් ස්ථාපිත කර තිබිය යුතු අතර, එය ව්‍යාපාරික ඒකකවලින් ස්වාධීන ව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු විසින් අධීක්ෂණය කළ යුතු ය.

42.3 මූල්‍ය සේවා සපයන්නාගේ මෙහෙයුම් අවදානම් හා සම්බන්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ හෝ මෙහෙයුම් අවදානම් අධීක්ෂණය කරන වෙනත් ඕනෑ ම කළමනාකරණ කමිටුවක රාජකාරිවල කොටසක් වශයෙන්, මූල්‍ය සේවා සපයන්නා විසින් තමන් වෙත ලැබෙන පැමිණිලි දත්ත මත පදනම් ව, පැමිණිල්ලට මූලික වූ හේතු විශ්ලේෂණය කළ යුතු අතර එම විශ්ලේෂණයන් තම මූල්‍ය නිපැයුම් සහ සේවා වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කළ යුතු ය.

43. මූල්‍ය සේවා සපයන්නාගේ පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය

43.1 **රෙගුලාසි 42** යටතේ සඳහන් කරන ලද පැමිණිලි භාරගැනීම සඳහා මාධ්‍යයන් කිහිපයක් සහිත ව පැහැදිලි ක්‍රියාපටිපාටීන් තිබිය යුතු අතර, උපකාරක කවුළු, දුරකථන අංක, ඒ සඳහා ම වෙන්වූ විද්‍යුත් තැපැල/ තැපැල් ලිපින සහ මාර්ගගත වෙබ් පෝරම ආදිය ඊට ඇතුළත් විය යුතු ය.

43.2 **රෙගුලාසි 42** යටතේ සඳහන් වන යාන්ත්‍රණය, ගාස්තු රහිත, සාධාරණ, පහසුවෙන් ප්‍රවේශ විය හැකි විනිවිදභාවයකින් යුත්, ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවලින් ස්වාධීන යාන්ත්‍රණයක් විය යුතු ය.

43.3 මූල්‍ය සේවා සපයන්නා විසින්, පැමිණිලිකරුට ඔහුගේ/ ඇයගේ පැමිණිල්ල ලද බව පැමිණිල්ල මෙහෙයවන නිලධාරියා/ නිලධාරීන් සම්බන්ධ කර ගත හැකි තොරතුරු සමග සාධාරණ කාලයක් තුළ ලිඛිත ව දැන්විය යුතු ය [වැඩ කරන දින පහක් (05) ඇතුලත ලබා දීම වඩාත් සුදුසු ය].

43.4 මූල්‍ය සේවා සපයන්නා විසින් පැමිණිලි සම්බන්ධීකරණය කිරීම සඳහා එහි සෑම ශාඛාවකම/ කාර්යාලයකම/ සේවා මධ්‍යස්ථානයකම නිලධාරියෙකු පත් කළ යුතු ය.

43.5 මූල්‍ය සේවා සපයන්නා විසින් අනාගත පරිශීලනය සඳහා සියලු ම පැමිණිලි පිළිබඳ වාර්තා පවත්වාගෙන යා යුතු ය.

**44. මූල්‍ය සේවා සපයන්නාගේ පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටියේ විනිවිදභාවය**

44.1 මූල්‍ය සේවා සපයන්නන් විසින් ගිවිසුම් ලිපි ලේඛනවල තම පැමිණිලි හැසිරවීම සඳහා වන නවතම යාන්ත්‍රණයන් පිළිබඳ තොරතුරු මූල්‍ය පාරිභෝගිකයින්ට ලබා දිය යුතු ය. තව ද, මූල්‍ය සේවා සපයන්නා විසින් පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය සහ පැමිණිලි හැසිරවීමට අදාළ වෙනත් තොරතුරු ද, පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය වෙනස් කර ඇත්නම් එය සිදු කළ දිනය, මූල්‍ය සේවා සැපයුම්කරුගේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කළ යුතු අතර පත්‍රිකා, පෝස්ටර් ආදිය ද මේ සඳහා යොදා ගැනීම කළ යුතු ය.

44.2 **උප-රෙගුලාසි 44.1** යටතේ සඳහන් තොරතුරුවලට පහත තොරතුරු ඇතුළත් විය යුතු ය:

i. පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා පවතින මාධ්‍යයන් ඇතුළු ව පැමිණිලි හැසිරවීමේ ඒකකය සම්බන්ධ කර ගත හැකි තොරතුරු;

ii. පැමිණිලි විසඳීම සඳහා ගත වන කාල පරාසයන්;

iii. ක්‍රියාවලියේ සෑම අදියරක දී ම පැමිණිලිකරුගේ වගකීම;

iv. මූල්‍ය සේවා සපයන්නාගේ වගකීම්;

v. පැමිණිලිකරු සෑහීමකට පත් නොවන අවස්ථාවල දි විවිධ මට්ටමින් පැමිණිල්ල ඉදිරියට රැගෙන යෑමේ ක්‍රියාවලිය; සහ

vi. විකල්ප ආරවුල් නිරාකරණ යාන්ත්‍රණ පිළිබඳ විස්තර (ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා, මහ බැංකුව අදාළ වන පරිදි).

**45. බැඳියාවන් අතර ගැටුම**

45.1 මූල්‍ය සේවා සපයන්නෙකු විසින් මූල්‍ය පාරිභෝගික පැමිණිලි හසුරුවන විට බැඳියාවන් අතර ගැටුම් වළක්වා ගත යුතු ය.

45.2 පැමිණිල්ල හසුරුවන නිලධාරියා, පැමිණිල්ලට අදාළ පාර්ශ්වයක් නම් හෝ පැමිණිල්ලට අදාළ නිලධාරියා ඍජුව අධීක්ෂණය කරයි නම් හෝ එම පැමිණිල්ලට/ පැමිණිලිකරුට බැඳියාවක් පවතී නම් එම නිලධාරියා පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලියට සම්බන්ධ නොවිය යුතු ය.

**46. මූල්‍ය සේවා සපයන්නා විසින් මූල්‍ය පාරිභෝගික පැමිණිලි විසඳීම සඳහා වන කාල රාමුව**

46.1 මූල්‍ය සේවා සපයන්නා විසින්, මූල්‍ය පාරිභෝගිකයාගෙන් පැමිණිල්ලක් ලැබීමෙන් පසු, ලිත් දින 21ක් ඇතුළත එම පැමිණිල්ල නිරාකරණය කළ යුතු ය. එසේ වුවත්, මූල්‍ය සේවා සපයන්නාට ලිත් දින 21ක් ඉක්මවීමට පෙර පැමිණිල්ල නිරාකරණය කිරීමට හැකියාවක් නොමැති නම්, ඒ බව, කාලය දීර්ඝ කිරීමට හේතු, මූල්‍ය සේවා සපයන්නා විසින් ගැටලුව විසඳීමට ඒ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ග සමග මූල්‍ය පාරිභෝගිකයාට දැනුම් දිය යුතු ය. මෙම කාලය දීර්ඝ කිරීම උපරිම මාස තුනකට සීමා විය යුතු ය.

46.2 කෙසේ නමුත්, මූල්‍ය සේවා සපයන්නා සහ මූල්‍ය පාරිභෝගිකයා යන දෙපාර්ශ්වයට ම ඇති වන බලපෑම, කඩිනමින් කළයුතු සහ අවදානම් පිළිබඳ ව සලකා බලා, ඉතා ඉක්මණින් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වන පැමිණිලි නිරාකරණය කිරීම සඳහා මූල්‍ය සේවා සපයන්නා විසින් අවශ්‍ය සියලු විධිවිධාන සැලසිය යුතු ය.

46.3 මූල්‍ය සේවා සපයන්නාට පැමිණිල්ල සඳහා සහන සැලසීමට නොහැකි අවස්ථාවක, ඉහත **උප-රෙගුලාසි 46.1** යටතේ නිශ්චිත ව දක්වා ඇති කාලය තුළ මූල්‍ය සේවා සපයන්නාගේ ස්ථාවරය පැමිණිලිකරුට පැහැදිලි කළ යුතු ය.

**47. මහ බැංකුවේ පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය**

විකල්ප යාන්ත්‍රණයක් ලෙස මූල්‍ය පාරිභෝගිකයින්ගේ පැමිණිලි සහ දුක්ගැනවිලි හැසිරවීම සඳහා මහ බැංකුව කටයුතු කරනු ලැබේ. කෙසේ වෙතත්, මූල්‍ය පාරිභෝගිකයින් හෝ මූල්‍ය සේවා සපයන්නන්හට මෙම ක්‍රියාවලිය අතරතුර ඕනෑ ම අවස්ථාවක නීතිමය ක්‍රියාමාර්ග හෝ වෙනත් ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයක පිහිට පැතීමට මෙයින් සීමා පැනවීමක් සිදු නොවේ.

47.1 මහ බැංකුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම

i. පැමිණිලිකරු විසින් මූල්‍ය සේවා සපයන්නාගේ ප්‍රතිචාරය පිළිබඳ ව සෑහීමකට පත් නොවන්නේ නම් හෝ **රෙගුලාසි 43 හා 46** යටතේ දක්වා ඇති පරිදි මූල්‍ය සේවා සපයන්නා විසින් පැමිණිල්ල සම්බන්ධයෙන් කටයුතු කර නොතිබේ නම් ඔහුට/ ඇයට මහ බැංකුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි ය. කෙසේ වුව ද, මූල්‍ය පාරිභෝගිකයා විසින් මූල්‍ය සේවා සපයන්නා වෙත පැමිණිල්ල ඉදිරිපත් කළ දින සිට වසරක් (01) ගත වීමට පෙර එය මහ බැංකුව වෙත එවිය යුතු ය.

ii. මහ බැංකුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේදී මහ බැංකුව නියම කර ඇති ආකෘති පත්‍රය සහ ආකාරය අනුව සිදු කළ යුතු ය.

47.2 මහ බැංකුව විසින් පැමිණිල්ලක් හසුරුවන අතරතුර, පහත හේතු මත මහ බැංකුව විසින් පැමිණිල්ල හැසිරවීම අවසන් කරනු ලැබේ:

i. මූල්‍ය පාරිභෝගිකයා හෝ මූල්‍ය සේවා සපයන්නා විසින් පැමිණිල්ල සම්බන්ධයෙන් අධිකරණය හරහා නඩුවක් ගොනු කළ විට;

ii. මූල්‍ය පාරිභෝගිකයා හෝ මූල්‍ය සේවා සපයන්නා විසින් මහ බැංකුව වෙත අයුතු බලපෑම් හෝ තර්ජන සිදු කළ විට (මෙවැනි අවස්ථාවක දී අදාළ පරිදි මහ බැංකුව විසින් නියාමන/ නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබිය හැක).

47.3 මහ බැංකුවේ තීරණය

i. මහ බැංකුව විසින් අවසන් තීරණයක් ගැනීමට පෙර, පැමිණිල්ල ඇගයීමකට ලක් කළ යුතු අතර සුදුසු උපදෙස්/ නිර්දේශ/ අදහස් සහිත ව ගැටලුව සුහදව විසඳා ගැනීමට මූල්‍ය සේවා සපයන්නාට නියම කළ හැක;

ii. මහ බැංකුවේ උපදෙස්/ නිර්දේශ/ අදහස් අනුව පැමිණිල්ල සතුටුදායක ලෙස විසඳීමට මූල්‍ය සේවා සපයන්නා අපොහොසත් වුවහොත් සහ මහ බැංකුව විසින් පැමිණිල්ල සම්බන්ධයෙන් තීරණයක් ලබා දීම අවශ්‍ය යයි නිගමනය කරන්නේ නම්, මහ බැංකුවෙහි අවසාන විසඳුම ලෙස මහ බැංකුව විසින් පැමිණිල්ල පිළිබඳ අවසන් තීරණයක් නිකුත් කළ යුතු ය.

iii. මහ බැංකුව විසින් මෙම රෙගුලාසි, ප්‍රශස්ත බැංකු පරිචයන්, යුක්තිසහගත සහ සාධාරණ ආකාර මත පදනම් ව තීරණයකට එළැඹිය යුතු අතර එම ක්‍රියාවලිය අධිකරණයේ ක්‍රියාපටිපාටීන්ට අනුගත වීමට අවශ්‍ය නොවේ.

iv. අවසන් තීරණයකට එළැඹීම සඳහා, මහ බැංකුව විසින් අතිරේක තොරතුරු/ ලේඛන ඉල්ලා සිටිය හැකි අතර අදාළ වන සියලු ම පාර්ශ්වයන්/ඕනෑ ම පාර්ශ්වයක් කැඳවා විභාග කිරීමට සහ/ හෝ ස්ථානීය පරීක්ෂණයක්/ විමර්ශනයක් පැවැත්වීම අදාළ පරිදි සිදු කළ හැක.

v. මූල්‍ය පාරිභෝගිකයා එකඟ වන අවස්ථාවල දී මූල්‍ය පාරිභෝගිකයෙකු විසින් යොමු කරන ලද පැමිණිල්ලක් සඳහා මහ බැංකුව විසින් ලබා දෙනු ලබන අවසන් තීරණය සම්බන්ධයෙන් මූල්‍ය සේවා සපයන්නා බැඳීමකට යටත්වේ.

vi. මහ බැංකුව වෙත සියලු ම වැදගත් තොරතුරු ලබා ගැනීමට හැකි වේ නම් දින 90ක් ඇතුළත පැමිණිල්ල සම්බන්ධයෙන් ලිඛිත තීරණයක් ලබා දිය යුතු ය. කෙසේ වෙතත්, පැමිණිල්ලේ සංකීර්ණත්වය අනුව, තීරණයක් ලබා දීමට ගන්නා කාලය දීර්ඝ වීමට ඉඩ ඇත.

vii. මහ බැංකුව පැමිණිල්ලකට අදාළව තීරණ ගැනීමේ දී, ස්වභාවික යුක්තිය පිළිබඳ පොදු මූලධර්මවලට අනුකූල විය යුතු ය.

viii. පැමිණිලිකරුවෙකුට මහ බැංකුව විසින් පැමිණිල්ලට අදාළව තීරණය ලබාදීමට පෙර, ලිඛිත ඉල්ලීමක් මත පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනීම හෝ මූල්‍ය සේවා සපයන්නා සමග පැමිණිල්ල සමථයකට පත් කර ගෙන ඇති අවස්ථාවක දී එම පැමිණිල්ල අවසන් වූ ලෙස සලකනු ලැබේ.

47.4 මහ බැංකුවේ තීරණය යටතේ ප්‍රදානයන්

i. **උප-රෙගුලාසි 47.3** යටතේ පැමිණිල්ලක් සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමෙන් පසු මහ බැංකුව විසින් පහත සඳහන් ඕනෑ ම ක්‍රියාමාර්ගයක් ගැනීමට මූල්‍ය සේවා සපයන්නා වෙත නියෝග කළ හැකි ය.

අ. බලපෑමට ලක් වූ මූල්‍ය පාරිභෝගිකයාට වන්දි සහ/ හෝ ප්‍රතිපූර්ණයන් ලබාදීම;

ආ. වැරදි දත්ත, තොරතුරු හෝ ප්‍රකාශන නිවැරදි කිරීම;

ඇ. පැමිණිල්ලට අදාළ වන ක්‍රියාකාරකමක්/ මෙහෙයුමක් නතර කිරීම හෝ වැළැක්වීම;

ඈ. විධිමත් ව සමාව අයැදීම;

ඉ. වෙනත් ක්‍රියාකාරකමක්/ මෙහෙයුමක් සිදු කිරීම හෝ වැළැක්වීම; හෝ

ඊ. මහ බැංකුවට සුදුසු යැයි හැඟෙන පරිදි පියවර ගැනීම.

ii. මහ බැංකුව හෝ මහ බැංකුව විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් සුදුසු පරිදි මූල්‍ය පාරිභෝගිකයා වෙත නිර්දේශ/ උපදෙස්/ අදහස්/ නිරීක්ෂණ ඉදිරිපත් කළ හැකි ය.

47.5 මූල්‍ය සේවා සපයන්නන් කිහිපදෙනෙක් සම්බන්ධ වන පැමිණිලි

මූල්‍ය පාරිභෝගිකයාගේ පැමිණිල්ලට මූල්‍ය සේවා සපයන්නන් කිහිපදෙනෙක් අදාළ වේ නම් මහ බැංකුව විසින් පැමිණිල්ල විසඳීමට අදාළව එම එක් එක් මූල්‍ය සේවා සපයන්නාගේ වගකීම් තීරණය කළ යුතු ය.

**මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් සහ තොරතුරු ආරක්ෂා කිරීම**

**48. මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් සුරක්ෂිත කිරීම**

මූල්‍ය සේවා සපයන්නා;

i. මූල්‍ය පාරිභෝගිකයාගේ නොසැලකිල්ල හෝ වංචනික හැසිරීම් හේතුවෙන් අලාභය සිදු වූ බව ඔප්පු නොවන අවස්ථාවල මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් වංචා කිරීම, අවභාවිතය සහ අයථා පරිහරණය හේතුවෙන් මූල්‍ය පාරිභෝගිකයාට සිදුවන අලාභයට වගකිව යුතු ය.

ii. මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් වංචා කිරීම, අයථා පරිහරණය සහ අවභාවිතයන්ට සම්බන්ධ සේවකයන්ට එරෙහි ව විනය ක්‍රියාමාර්ග ගෙන ඒ සම්බන්ධයෙන් මහ බැංකුවේ අදාළ නියාමන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු ය.

iii. වංචනික කටයුතු, මූල්‍ය පාරිභෝගිකයින්ගේ වගකීම් සහ එබඳු තර්ජනවලින් ආරක්ෂා වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මූල්‍ය පාරිභෝගිකයින් අඛණ්ඩව දැනුවත් කිරීම් සිදු කළ යුතු ය.

iv. දත්තවල නිරවද්‍යතාව සහතික කිරීමට සහ අවසානයේ දත්ත ආරක්ෂණය වැඩිකරලීම සඳහා මූල්‍ය පාරිභෝගිකයින්ගේ වාර්තා නිතිපතා සහ අවශ්‍ය අවස්ථාවල දී යාවත්කාලීන කිරීමට මූල්‍ය පාරිභෝගිකයන්ට නියම කළ යුතු ය.

v. මූල්‍ය පාරිභෝගිකයින්හට අවශ්‍ය වන වාර්තා යාවත්කාලීන කිරීම් සිදු කළ හැකි පහසු ක්‍රමයක් නිර්මාණය කළ යුතු ය.

**49. පෞද්ගලික තොරතුරුවල රහස්‍යභාවය, ආරක්ෂාව සහ විශ්වසනීයත්වය**

49.1 මූල්‍ය සේවා සපයන්නා විසින් මූල්‍ය පාරිභෝගිකයාගේ පෞද්ගලික තොරතුරුවල රහස්‍යභාවය, ආරක්ෂාව සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සකස් කර ක්‍රියාත්මක කළ යුතු ය.

49.2 මූල්‍ය සේවා සපයන්නා විසින් මූල්‍ය පාරිභෝගිකයින්ගේ පෞද්ගලික තොරතුරු අයථා පරිහරණය කිරීම නොකළ යුතු අතර, එහි සේවකයන් හෝ ආයතනය වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් පාර්ශ්වයක් විසින් පෞද්ගලික තොරතුරු අයථා ලෙස භාවිත නොකරන බව සහතික කළ යුතු ය.

49.3 මූල්‍ය සේවා සපයන්නා සතු ව මූල්‍ය පාරිභෝගික දත්ත වෙත අනවසරයෙන් ප්‍රවේශ වීම, වෙනස් කිරීම, හෙළිදරව් කිරීම, අහඹු නැතිවීම හෝ විනාශ කිරීම වැළැක්වීම සඳහා සුදුසු ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ දත්ත ආරක්ෂණ පියවර සහ කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පැවතිය යුතු ය.

**50. මූල්‍ය පාරිභෝගික පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම**

මූල්‍ය සේවා සපයන්නා විසින්;

i. මූල්‍ය පාරිභෝගිකයින්ගේ පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සඳහා සුදුසු ආරක්ෂක සහ පාලන පියවර ස්ථානගත කළ යුතු අතර වෙනත් ඕනෑ ම නීතියකින් අවශ්‍යවන්නේ නම් හැර කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ/ ඉකුත් වීමේ සිට අවම වශයෙන් වසර හයක කාලයක් සඳහා එම තොරතුරු රඳවා තබා ගැනීම සිදු කළ යුතු ය.

ii. මූල්‍ය පාරිභෝගිකයාගේ කැමැත්ත ඇතිව හෝ නීතියෙන් නියම කරන අවස්ථාවල දී හැර මූල්‍ය පාරිභෝගිකයාගේ පෞද්ගලික තොරතුරු තෙවන පාර්ශ්වයක් වෙත ලබා දීම සිදු නොකළ යුතු ය.

iii. කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ/ ඉකුත්වීමේ දිනයේ සිට අවම වශයෙන් වසර හයක් ගතවන තෙක් ඊට අදාළ මූලික තොරතුරු, ගිවිසුම්ගත ලේඛන සහ සියලු ම ගනුදෙනු වාර්තා රඳවා තබා ගත යුතු ය.

iv. වෙනත් නීතිමය අවශ්‍යතාවන් මගින් වෙනස් වන්නේ නම් මිස ගනුදෙනු සිදු කළ දිනයේ සිට අවම වශයෙන් වසර හයක් සඳහා ඊට අදාළ සියලු ම මූලාශ්‍ර ලේඛන රඳවා තබා ගත යුතු ය.

**51. දත්ත රැස් කිරීම සහ භාවිතය**

51.1 මූල්‍ය සේවා සපයන්නන් විසින් නිශ්චිත, පැහැදිලි සහ නීත්‍යානුකූල අරමුණු සඳහා පමණක් නීත්‍යානුකූල සහ සාධාරණ ක්‍රම භාවිතා කරමින් ඒ සඳහා අදාළ ඕනෑ ම නීතියක, නියෝගයක හෝ මාර්ගෝපදේශයක සීමාවන් තුළ රැඳෙමින් මූල්‍ය පාරිභෝගිකයන්ගේ පෞද්ගලික තොරතුරු රැස් කළ යුතු ය.

51.2 මූල්‍ය සේවා සපයන්නන් සතු ව මෙම රෙගුලාසි සහ අනෙකුත් අදාළ නීතිවලට අනුකූල වන පරිදි, ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලික තොරතුරු එකතු කිරීම සහ භාවිත කිරීම සඳහා වන ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් තිබිය යුතු වන අතර

එයට තොරතුරු රැස් කිරීමේ ක්‍රම, අරමුණු සහ රැස් කරන තොරතුරු වර්ග සහ තොරතුරු රඳවා ගැනීම ඇතුළත් විය යුතු වේ.

51.3 පෞද්ගලික තොරතුරු රැස් කිරීම, රඳවා තබා ගැනීම සහ භාවිතා කිරීම සිදු කිරීමේ දී මෙම රෙගුලාසිවලට අමතරව, ශ්‍රී ලංකාව තුළ මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි ව පවතින නීති සහ දත්ත ආරක්ෂණ නීති ද ඇතුළු ව වෙනත් අදාළ නීතිවලට අනුකූල ව කටයුතු කළ යුතු වේ.

51.4 මූල්‍ය සේවා සපයන්නන් විසින් දත්ත එක්රැස් කරන ලද අරමුණ සඳහා පමණක් පාරිභෝගික දත්ත භාවිතය සීමා කරන පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා වන අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය.

51.5 මූල්‍ය සේවා සපයන්නන් විසින් පහත අවස්ථාවන් සඳහා පමණක් මූල්‍ය පාරිභෝගිකයෙකුගේ පෞද්ගලික තොරතුරු භාවිතා කළ හැක.

i. මූල්‍ය පාරිභෝගිකයාට සාධාරණ ලෙස පෙනීයන හෝ මූල්‍ය පාරිභෝගිකයා විසින් සාධාරණ වශයෙන් අපේක්ෂා කළ හැකි, තොරතුරු රැස්කරගත් මුල් අරමුණට අනුකූල වන වෙනත් අරමුණක් සඳහා; හෝ
ii. පාරිභෝගිකයාගේ දැනුවත්බව සහිත කැමැත්ත ඇති ව; හෝ
iii. මෙම රෙගුලාසි හෝ වෙනත් නීතියක් මගින් නියම කර හෝ අවසර දී ඇති පරිදි.

51.6 ආබාධිතභාවය (විශේෂ අවශ්‍යතා) පිළිබඳ ඔහුගේ/ඇයගේ පෞද්ගලිකත්වය පවත්වා ගැනීමට මූල්‍ය පාරිභෝගිකයින්ට අයිතියක් ඇත.

51.7 මූල්‍ය පාරිභෝගිකයින්ට පහසුකම් සැලසීම හෝ මූල්‍ය පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම හැර වෙනත් කිසිදු අරමුණක් සඳහා මූල්‍ය සේවා සපයන්නන් විසින් ආබාධිත (විශේෂ අවශ්‍යතා) පුද්ගලයින්ගේ සංවේදී තොරතුරු භාවිත නොකළ යුතු ය.

51.8 මූල්‍ය සේවා සපයන්නන් විසින් මූල්‍ය පාරිභෝගිකයින්ගේ පූර්ව අනුමැතියකින් තොර ව ඔවුන්ගේ ආබාධිතභාවය (විශේෂ අවශ්‍යතා) හෝ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු වෙනත් පාර්ශ්වයකට හෙළි නොකළ යුතු ය.

52. **මූල්‍ය පාරිභෝගික තොරතුරු බෙදා ගැනීම**

මූල්‍ය සේවා සපයන්නා විසින් පහත අවස්ථාවන් හැරුණු කොට අලෙවිකරණය, ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය ඇතුළු ව වෙනත් කිසිදු අරමුණක් සඳහා පාරිභෝගිකයන්ගේ තොරතුරු තෙවන පාර්ශ්වයක් සමග බෙදා නොගත යුතු ය.

i. මූල්‍ය පාරිභෝගිකයාට සාධාරණ ලෙස පෙනී යන හෝ මූල්‍ය පාරිභෝගිකයා විසින් සාධාරණ වශයෙන් අපේක්ෂා කළ හැකි තොරතුරු රැස්කරගත් මුල් අරමුණ සඳහා; හෝ
ii. මූල්‍ය පාරිභෝගිකයාගේ දැනුවත්බව සහිත කැමැත්ත ඇතිව; හෝ
iii. මෙම රෙගුලාසි හෝ වෙනත් නීතියක් මගින් වෙනත් ආකාරයකින් අවශ්‍ය හෝ අවසර දී ඇති පරිදි.

53. **තම පෞද්ගලික තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ නිවැරදි කිරීමට මූල්‍ය පාරිභෝගිකයින් සතු අයිතිවාසිකම්**

53.1 මූල්‍ය පාරිභෝගිකයෙකුගේ ඉල්ලීමක් මත, මූල්‍ය සේවා සපයන්නා විසින් නීතියෙන් තහනම් කර ඇති අවස්ථාවක හැරුණු කොට ඔවුන් සතු ව තබා ගන්නා එම මූල්‍ය පාරිභෝගිකයා පිළිබඳ ඕනෑ ම පෞද්ගලික තොරතුරක් වෙත ප්‍රවේශය පහත පරිදි සැපයිය යුතු ය:

i. මූල්‍ය පාරිභෝගිකයාට තේරුම් ගත හැකි ආකාරයෙන් ;
ii. සාධාරණ කාලයක් ඇතුළත ; සහ
iii. මූල්‍ය පාරිභෝගිකයාට අවම පිරිවැයකින් හෝ පිරිවැයකින් තොර ව ;

53.2 මූල්‍ය පාරිභෝගිකයෙකු විසින් මූල්‍ය සේවා සපයන්නෙකු සතු කිසියම් පෞද්ගලික දත්ත වැරදි හෝ අසම්පූර්ණ බව කියා සිටින්නේ නම්, එම මූල්‍ය සේවා සපයන්නා විසින් එම ඉල්ලීම සමාලෝචනය කර පෞද්ගලික තොරතුරු වැරදි හෝ අසම්පූර්ණ වන්නේ නම්, සාධාරණ කාලයක් ඇතුළත එය නිවැරදි කර, ඊට පෙර එම තොරතුරු තෙවන පාර්ශ්වයක් වෙත ලබාදී ඇත්නම් එම තොරතුරු නිවැරදි කිරීම සඳහා අදාළ පාර්ශ්වය දැනුම්වත් කිරීමට සුදුසු පියවර ගත යුතු ය.

## අර්ථ දැක්වීම

54. මේ රෙගුලාසියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස:

"අනිසි ණය අයකර ගැනීම" යන්නට පහත අවස්ථා ඇතුළත් වේ.

(අ) ණයගැතියන්ගෙන් අයවිය යුතු මුදල් නීති විරෝධී ලෙස එකතු කිරීම;
(ආ) කිසියම් ව්‍යාජ ප්‍රකාශයක් භාවිත කිරීම; සහ
(ඇ) බිය ගැන්වීම, හිරිහැර කිරීම සහ බලපෑම් කිරීම.

"ප්‍රවේශ විය හැකි ආකෘතිය" යන්නෙන් විද්‍යුත්/ ලේඛන ආකෘතිය, සිංහල සහ දෙමළ සඳහා යුනිකෝඩ් අකුරු සහිත විද්‍යුත්/ ලේඛන ආකෘතිය හෝ වැඩිහිටි, ආබාධිත හෝ අඩු මූල්‍ය සාක්ෂරතාව සහිත මූල්‍ය පාරිභෝගිකයන් සඳහා පහසුකම් සපයන වෙනත් ඕනෑ ම යාන්ත්‍රණයක් අදහස් වේ.

"ප්‍රවේශතාව" යන්නෙන් මූල්‍ය සේවා සපයන්නා විසින් සපයනු ලබන සියලු ම මූල්‍ය සේවාවන් සඳහා සමාන සහ සාධාරණ ප්‍රවේශයක් ලබා දීම අදහස් වේ.

"උපකාරී තාක්ෂණය සහ උපකරණ" යන්නෙන් ආබාධ සහිත පුද්ගලයින්ගේ ක්‍රියාකරවීමේ හැකියාව වැඩි කිරීම, පවත්වාගෙන යෑම හෝ දියුණු කිරීම සඳහා යොදා ගන්නා ඕනෑ ම භාණ්ඩයක්, උපකරණ කොටසක්, මෘදුකාංග වැඩසටහනක් හෝ නිපැයුම් පද්ධතියක් අදහස් වේ.

"පොත්, වාර්තා, ගිණුම්, ලේඛන, සහ තොරතුරු" යන්නෙන් කඩදාසි සහ ඉලෙක්ට්‍රොනික, දෘශ්‍ය, චුම්බක හෝ ඕනෑ ම තොරතුරු පද්ධතියක ගබඩා කර ඇති කඩදාසි සහ දත්ත ඇතුළු ව ඕනෑ ම මාධ්‍යයක වාර්තා කර ඇති හෝ ගබඩා කර ඇති පොත්, වාර්තා, ගිණුම්, ලේඛන හෝ තොරතුරු අදහස් වේ.

"නිපැයුම් එකට එකතු කිරීම" යන්නෙන් මූල්‍ය සේවා සපයන්නා විසින් යෝග්‍ය වන පරිදි මූල්‍ය සේවාවන් දෙකක් හෝ වැඩි ගණනක් ඒකාබද්ධ එක් මූල්‍ය සේවාවක් වශයෙන් අලෙවි කිරීම අදහස් වේ.

"මහ බැංකුව" යන්නෙන් 1949 අංක 58 දරන මුදල් නීති පනත (422 පරිච්ඡේදය) යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

"පැමිණිල්ල" යන්නෙන් මූල්‍ය සේවා සපයන්නා විසින් සපයනු ලබන මූල්‍ය නිපැයුම් හෝ සේවාවක් සහ ඊට සම්බන්ධ අනෙකුත් අංශ පිළිබඳ ව මූල්‍ය පාරිභෝගිකයෙකු විසින් අතෘප්තිය ප්‍රකාශ කිරීම අදහස් වේ.

"ණය පහසුකම" යන්නෙන් මූල්‍ය සේවා සපයන්නෙකු සහ මූල්‍ය පාරිභෝගිකයෙකු අතර ශේෂ පත්‍රය තුළ සඳහන් හෝ ශේෂ පත්‍රයෙන් බැහැර ණය පහසුකම් වශයෙන් විවිධ අරමුණු සඳහා යම් මුදල් ප්‍රමාණයක් යම් කාල සීමාවක් සඳහා ණයට ගැනීමට ඉඩ සලසනු ලබන එකඟතාව අදහස් වේ.

"මූල්‍ය පාරිභෝගිකයා" යන්නෙන්, මූල්‍ය සේවා සපයන්නන් හැර මූල්‍ය සේවා සපයන්නන් විසින් සපයනු ලබන ඕනෑ ම මූල්‍ය නිපැයුමක් හෝ සේවාවක් භාවිත කරන, භාවිත කර ඇති හෝ භාවිත කිරීමට හැකියාව ඇති පුද්ගලයෙක් හෝ ආයතනයක් හෝ නීතිමය ආයතනයක් හෝ එවැනි පාරිභෝගිකයෙකුගේ අවසරලත් නියෝජිතයෙක් අදහස් වේ.

"මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය" යන්නෙන් පාරිභෝගික අයිතීන් සුරක්ෂිත කිරීම, දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට පාරිභෝගිකයින්ට හැකියාව ලබා දීම සහ මූල්‍ය සේවා සපයන්නකු මගින් නිපැයුම් සහ සේවා සැපයීමේ දී සාධාරණත්වය සහතික කිරීම සඳහා වන නීති, රෙගුලාසි, චක්‍රලේඛ, නියෝග, මාර්ගෝපදේශ, ප්‍රතිපත්ති සහ ආයතන අදහස් වේ.

"මූල්‍ය සේවා සපයන්නන්" යන්නෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම්, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන, බලයලත් ප්‍රාථමික අලෙවිකරුවන්, බලයලත් මුදල් හුවමාරු සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන, ගෙවීම් සහ පියවීම් පද්ධතියේ සහභාගිකරුවන් සහ මුදල් මණ්ඩලය මගින් අනුමැතිය ලත් වෙනත් ඕනෑ ම ආකාරයක මූල්‍ය සේවා සපයන්නකු අදහස් වේ.

"ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය (ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය/ ප්‍රධාන වගකීම් සහිත පුද්ගලයන්)" යන්නෙන් මූල්‍ය සේවා සපයන ආයතනයක ඕනෑ ම විධායක අධ්‍යක්ෂවරයෙකුද ඇතුළු ව සෘජුව හෝ වක්‍රව ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා අධිකාරී බලය සහ වගකීම ඇති ඕනෑ ම පුද්ගලයෙකු අදහස් වේ.

"මෙහෙයුම් කළමනාකරණ කාර්ය මණ්ඩලය" යන්නෙන් මූල්‍ය සේවා සපයන්නන්ගේ ශාඛා කාර්යාලයක කළමනාකරුවෙකු හෝ කළමනාකරු වෙනුවෙන් ක්‍රියා කරන පුද්ගලයකු ද ඇතුළු ව එදිනෙදා තීරණ ගැනීම සඳහා සහභාගී වන නිලධාරීන් අදහස් වේ.

"පෞද්ගලික තොරතුරු" යන්නෙන් මූල්‍ය පාරිභෝගිකයකු පිළිබඳව පෞද්ගලිකව හඳුන්වන හා මූල්‍ය තොරතුරු ද ඇතුළුව ඕනෑම තොරතුරක් අදහස් වේ.

"නිපැයුම් හෝ සේවා" යන්නෙන් මූල්‍ය සේවා සපයන්නකු විසින් මූල්‍ය පාරිභෝගිකයකු වෙත සපයනු ලබන හෝ අර්පණය කරන ඕනෑ ම මූල්‍ය උපකරණයක්, ක්‍රියාකාරකමක්, ගනුදෙනුවක් අදහස් වේ.

"නිපැයුම් හෝ සේවා එකට ඈඳීම" යන්නෙන් විකිණීමේ දී වෙන්කර හඳුනා ගැනීමේ විකල්පයකින් තොර ව මූල්‍ය නිපැයුම් හෝ සේවා දෙකක් හෝ වැඩි ගණනක් එක්ව විකිණීම අදහස් වේ.

EOG 08-0087

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.